# පිරිහුණු ගම

පූජ්‍ය ගල්ගමුවේ සාසනසිරි හිමි.

ප්‍රථම මුද්‍රණය : ශ්‍රී බුද්ධ වර්ෂ - 2606
: කිතු දේව වර්ෂ - 2017
: සිදුහත් බෝසත් උප්පත්ති වර්ෂ - 2641
: සම්මා සම්බුදු වර්ෂ - 2561

**සම්පාදනය**
**පූජ්‍ය ගල්ගමුවේ සාසනසිරි හිමි.**
ලුණුඅටුව රජගල්ලෙන, නවරත්නගොඩ, උඩතැන්න, මාතලේ.

සමාරාධනය : සිසිර ජයසිංහ, මයුරාගම, සෙවනගල.

පිටකවර සැකසුම : යස්මන් ජයවර්ධන

පරිගණක අකුරු සැකසුම : ෂෙරීකා - 077-4104665

මුද්‍රණය : ඊසි ප්‍රින්ට්

# පිරිහුණු ගම

පිරිහුණු ගමේ සිට
වියෝ දුක විඳගෙන සෝ සුසුම් මැදින්
ඇටමැස්ස කන්දට ගොස්
මව්පිය ගුණ වරුණ අසාගෙන
අම්මේ... සැනසෙමින්
පාරමී ගමනින්
ගමනක අවසානය සඳහා
කර්ම විපාක දෙන සැටි දැන
කයේ සැටි මේ බලන්න.

පූජ්‍ය ගල්ගමුවේ සාසනසිරි හිමි.

# පටුන


| | | |
|---|---|---|
| 01. | පිරිහුණු ගම | 01 |
| 02. | වියෝ දුක | 08 |
| 03. | සෝ සුසුම් | 14 |
| 04. | ඇටමැස්ස කන්ද | 19 |
| 05. | මව්පිය ගුණ වරුණ | 22 |
| 06. | අම්මේ සැනසෙන්න | 38 |
| 07. | පාරමී ගමන | 43 |
| 08. | ගමනක අවසානය | 55 |
| 09. | කර්ම විපාක දෙන සැටි | 66 |
| 10. | කයේ සැටි මේ බලන්න | 76 |

# පිරිහුණු ගම

01. අනුරපුරට නුදුරුව රජ රට පැත්තේ
ගල්ගමුව නම් නගරෙකි පිහිටා ඇත්තේ
මෙහි සිට මයිල සතරක් පෙර ගිර පැත්තේ
ගිය විට සොඳුරු වන ගම දැක ගත හැක්කේ

02. මහ නුග ගසක් මහ පාරට සෙවණ සදයි
යන එන සැමට ඉන් ඇතිවන්නේ සිසිලයි
බටගොයි කොබෙයි ගිරවුන්ගේ රජ දහනයි
මෙහි පෙරමුණ ම ඇත්තේ ගම ගුරු නිවසයි

03. තුන් මන්සල පිහිටා ඇත ගම මැද්දේ
පොඩි තේ කඩය පිහිටියෙ හන්දිය මැද්දේ
සිව් දිග සිටින ගැමියන් මෙතැනට ඇද්දේ
රසබර වදන් මුවගින් මුවගට පැද්දේ

04. කඩදහි කුට්ටමක් සිය සුරතෙහි රඳන
සිවු දෙන බැගින් තැන තැන රවුමට සිටින
මේ කඩපිළේ සැමදා පාලුව මකන
තරුණන් සිටී මෙහි සමගිව සෑම දින

05. තව ටික දුරක් ගිය විට ඉදිරියට බලා
හතරේ කණුව සිටිනවා අයිනකට වෙලා
මෙහි පෙරමුණේ ඇති මඟ වම් අතට බලා
ගිය විට හැකිය පන්සල දැකගන්න බලා

06. මහ උස් ගලක් ඇත මනහර ලෙස පිහිටී
ළමයින් මෙහි සිටී නිරතුරු හුරු බුහුටී
ගල උඩ ඉඳන් නරඹන විට අවට හැටී
ඈතින් පෙනෙන්නේ ගල්ගිරියෙ කඳු වැටී

07. පෙර රජ දවස හෙළ මහ විරුවන් සැදුවයි
ගම මැද්දේ ම පිහිටා ඇති දෙඹට වැවයි
වැව පහළින් ම පිහිටියෙ ගම වෙල් යායයි
මෙමඟින් මෙහි දනන්ගේ බඩ වියත රැකෙයි

08. පොල් අතු වහල සහ කටු මැටි ගැහු බිත්ති
මොනවට කියයි මෙහි ගැමියන්ගේ විත්ති
දැක ගත නොහැක ගඩොලින් ඉදි කළ බිත්ති
ගුණ දහමින් බැඳී ඇත හොඳ සවි ශක්ති

09. සැම නිවසක ම ඇත සම්බුදු සමිඳු රුව
ඒ අසලින් ම ඇත සීවලි හිමිගෙ රුව
ගෙයි පෙරමුණේ දෙවියන් හට කැප කෙරුව
පහනක් දිලේ සවසට ගණඳුර දුරුව

10. සැම නිවසකම ඇත අටු කොටු සපිරීලා
සැම සුරතකම මිල මුදලුත් ඇත රැඳිලා
සැම හදවතම මෙත් කරුණායෙන් පිරිලා
සැම මුහුණකම ඇත්තේ සොම්නස් රැඳිලා

11. සොයුරු පෙමින් ඇත්තෙ සැම දෙන බැඳිලා
මෙත් කරුණා ගුණෙන් සැම හදවත් තෙමිලා
හෙළ බොදු සිරිත් සැම අකුරට ඉටු කරලා
සාමෙන් සමාදනෙන් සැම එකතු වෙලා

12. වැව් කණ්ඩියේ සිට සතුටින් බලනු සොඳ
මහනර නෙළුම් පොකුණක් සේ පෙනේ සඳ
රසවත් නෙළුම් බටු තෝරා ගන්න බෙද
පියුමන් ගෙනයන්න වඳිනට මුනිඳු පුද

13. සුළඟින් සැලේ ගොයමින් සැදි වෙල් එළිය
සිසිලෙන් දිලේ විහඟුන් රැඳි ලඳු කැලය
අසලින් පෙනේ ගිජිඳුන් ඇති මහ වනය
එම නිල් කැලෙන් වට වූ ගම මනහරය

14. හිරු සඳු කැන් වැදී වන මල් පුබුදිනවා
මී මැස්සන් පැමිණ ගුම් නද පතුරනවා
වන මල් නොතලමින් රොන් අරගෙන යනවා
වනයේ තැනින් තැන මී වද මෝරනවා

15. අඹ දඹ පේර වැළ වරකා හිඹුටු ඉදී
දඹ පලු වීර එරමිණියා කරඹ සැදී
නාරං දෙඩම් කජු පුහුලන් දිවුල් ඉදී
මිනිසුන් මෙන් ම සියොතුන් මෙහි රසය විඳී

16. ඈතින් ඇසෙන්නේ කොවුලන්ගේ නාදේ
මෑතින් ඇසෙන්නේ සැවුලන්ගේ නාදේ
හේනෙන් ඇසෙන්නේ පැල් කවියේ නාදේ
කුඹුරෙන් ඇසෙන්නේ සිව් පදයේ නාදේ

17. වනයෙන් ඇසෙන්නේ ගිජිඳුන්ගේ නාදේ
පැල්පත් තුළින් එයි නැළවිලි ගී නාදේ
සැමතින් ඇසෙන්නේ කුකුළන්ගේ නාදේ
පන්සල දෙසින් රැව් දේ ඝණ්ඨා නාදේ

18. නිල්වන් ලෙසින් බබලන ගම වෙල් එළියේ
රන්වන් කරල් බිමටම නැමී නැමී තියේ
මදනල හමා යයි නිරතුරු සිලි සිලියේ
පිණි කැට දිලෙයි අලුයම නැගි හිරු එළියේ

19. කුඹුක් ගස් වැඩුණු සරුවට දෙඹට වැවේ
නිල් තණින් සුසැදි මේ ගම වැව් පිටියේ
එළ ගව රැන නිරුතුරුව ම මෙහි සිටියේ
දරු පැටව් උන්ගේ දැක සිත් පිනා ගියේ

20. කැටපෝලයක් නිරුතුරු සුරතින් දරන
දුව පැන ඇවිදිමින් නිති සෙල්ලම් කරන
සුන්දර වන ගමට සිරියාවක් ගෙනෙන
දුටු දුටු දනගෙ සිත් පිනවයි කොලු රැන

21. යන එන සැමදෙනාටම මෙහි සිත පිනවා
නගරෙන් වරින් වර මිනිසුන් මෙහි එනවා
සංකර විශම ගති ගමටත් බෝ වෙනවා
සුන්දර ගමේ අසිරිය නැති වී යනවා

22. සුදුව සුරා සොර මැරකම් ඇති වෙනවා
පාපය දුරාචාරය පැතිරී යනවා
බේදය කුහක ගති සිත් තුළ දැඩි වෙනවා
සාමය සමාදනය නැති වී යනවා

23. අන් සැම දෙනාවම වැනසීලා යේවා
මාවත් මගේ අඹු දරුවොත් සැනසේවා
මේ සිතුවිල්ල සැම හදකම බලපෑවා
සාමය සමාදනය දෙදරුම් කෑවා

24. තණ්හා මෝහයෙන් සිත දූෂිත වූවා
ගම රැකුමට තිබු වනයම වැනසූවා
දිය උල්පත් සිඳී මිහිකත රත් වූවා
මුළු ගම නියං රකුසා හට බිලි වූවා

25. මහ සයුරක් ලෙසින් පිරිලා තිබුණු වැව
සේරුන් දිය කොකුන් මෙහි නිති සැරි සැරුව
සුදෝ සුදට කෙකටිය මල් පිපුණු රුව
පාලු වු සොහොන් පිටියකි අද දෙඹට වැව

26. නිල්වන් ලෙසින් පෙර මෙහි තිබු වෙල් යායේ
රන්වන් කරල් දුටු විට සිත පිනා ගියේ
නිදිකුම්බාවලින් අද මෙය වැසී තියේ
වැසි නැති නිසා හෙන ගැසු පිටියක් වූයේ

27. ඉපනැලි රස විඳින මෙගමේ වෙල් එළියේ
අසරණ ගව රැන සමගිව වැව් පිටියේ
කළ පවු නිසා නිල් තණ බුදිමින් සිටියේ
අද දැක ගන්න නැත ගවයින් වැව් පිටියේ

28. සුදුව සුරා දුසිරිත්කම් වැඩි වූයේ
ගොවිතැන් නැසී අග හිඟකම් ඇති වූයේ
කළ පව් නිසා ගැමියන් දුක්ඛිත වූයේ
ගවයන් සැවොම මස් කඩයට දැක්කූයේ

29. මැදියම් රැයේ ඇසුනේ හඬ ගිපිඳුන්ගේ
තොපගේ රජ දහන මිනිසුන් වැනසුවනේ
ගමටත් සම්පතක් වූ ඇත් රපිඳුන්නේ
දැන් තොප සිටින්නේ කොහි දැයි කියනු මැනේ

30. අද දැක ගන්න නැත මෙහි පෙර සිරියාව
වනයේ තැනින් තැන තිබු දඬුවැල් බෑව
නොඇසේ බිගුන්ගේ ගුමු ගුමු ගී රාව
වියැකී ගියේ කිම මේ ලෙස මිහිරාව

31. නොඇසේ ගැමි ලියන් ගැයු ගැමි ගී රාව
හර බර ලෙසින් ගැයු පැල් කවියේ රාව
හේනෙත් පැළෙත් දැන් ඇත්තේ රේඩියොව
හඬ දෙයි සැම තැනම සංකර ගී රාව

32. ගෙපැලක් තුළට ගොස් බැලුවොත් සතර කොනේ
නැත දැක ගන්න පෙර තිබු බුදු රුවන අනේ
ආගම දහම ගැන් මෙහි තිබු සෙනෙහෙ ගුනේ
මේ බොදු ගමින් ඇයි මෙලෙසින් තුරන් වුනේ

33. නොඇසෙයි එද ඉමිහිරි සිවු පද රාව
පොල් අතු පැලෙන් ආ නැළවිලි ගී රාව
සැම නිවසකම අද ඇත්තේ රේඩියොව
කන් දෙක දෙදරවයි සංකර ගී රාව

34. පෙර මේ ගමේ සිටි ළමයින් පියකරුව
අසරණ සතුන් වෙත පෑවා කරුණාව
අද සිටිනවුන් වීලා ඇත රකුසන්ව
තම මව් පියන්ටත් නැත අනුකම්පාව

35. එක මව් කුසින් බිහි වී එක කිරි බීලා
එකටම සැදී එක පැදුරේ නිදියාලා
එක බත්පත එකට හිඳ රස කර කාලා
එක සොහොයුරන් ඇයි අද මේ බේද වෙලා

36. පායයි අදත් වෙනදා මෙන් සඳ දිලෙන
නොපෙනෙයි එහෙත් ගවයින් නිල් තණ බුදින
අමුතුම මිහිරියාවක් ගමටම ගෙනෙන
අද දැකගන්න නැත ඒ ගැමි කොලු රෑන

37. දෙවියන් පිහිට වුණි පෙරදා මේ ගමට
ගුණ යහපත්කමින් සිටි පෙර ගැමියන්ට
තෙරුවන් සරණ නොතකන අද දුදනන්ට
බැහැ පිළිසරණ දෙවියන්ගෙන් ලැබ ගන්ට

38. ඉසි කෝ මද මාන ගුණමකුකම් පෙන්නා
මෙත් කරුණාව ඈතට දැම්මා පන්නා
අද මිටු කුහක ගතියෙන් ජීවත් වෙන්නා
මෙලොවට පමණි පරලොව ගැන නොසිතන්නා

39. ගැමි ජීවන සුවඳ අද නැත ගම්මානේ
මිනිසුන් අතින් එය වැනසී යනවානේ
මෙය සිහිවෙද්දි හදවත වාවනු බැහැනේ
මිනිසා විසින් මිනිසා වනසනවානේ

40. මිනිසුන් කෙරෙන් අදමිටුකම් දුරු වේවා
කාලෙට වැසි වැටී මිහිකත සැනසේවා
කෙත්වතු සාර වී අටු කොටු සපිරේවා
පාලක පිරිස් දැහැමෙන් රට සුරකීවා

41. මව් පිය සොහොයුරන් නිති සුවපත් වේවා
සිප් දුන් ගුරුතුමන් හට සෙත සැලසේවා
නෑසියො හිතවතුන් නිදුකින් වැජඹේවා
මැදහත් අහිතවත් සැම සුවපත් වේවා

42. මුළු රට පුරා නව ගම් බිම් ඉදි වේවා
ගමින් ගමට සාමයෙ හඬ පැතිරේවා
ගැමි ජීවන සුවඳ ගම් තුළ සුරැකේවා
පිරිහුණු ගමට නව එළියක් ඇති වේවා

නිමි.

**කතු හිමිගේ අනාවැකිය:**

**පවුල් දෙකක පරපුරෙන් යුත් සුන්දර දෙඹටවැව නම් වූ පිරිහුණු ගම අනාගතයෙහි ඉතා දියුණු තත්ත්වයට පත් වෙයි. එකලට මුල් පදිංචිකරුවන්ගේ පරපුර අභාවයට ගොස්, වෙනත් පිරිස් එහි බලවතුන් වේ.**

# වියෝ දුක

01. පළඟැටියන් හඬන නිරතුරු අඳුරු  රැයේ
පුන්සඳ නැඟී එයි බැබලී නුඹ  කුසයේ
සිතිවිලි රැසක පැටලීගෙන සොඳුරු  රැයේ
අතීතයේ සිතුවම් පට  නැරඹූයේ

02. විසිතුරු ජවනිකා මනසින්  මැවීගෙන
නළු නිළියන් රඟයි ඡායාවන්  ලෙසින
සංවේගය දැනෙයි හදවත  පෙලාගෙන
බිහිසුණු ජවනිකාවකි මෙසසර  රඟන

03. නිවසින් පිටව මපියා සිටි වෙන  ගෙයක
මා හා කැටුව අම්මා දවසක්  රැයක
අහරත් රැගෙන පියතුම වෙත ගිය  විටෙක
සිදු වූ පුවත තවමත් ඇත හද  කොනක

04. ගෙන ගිය අහර පෙට්ටිය ඔහු විසි  කෙරුවා
කෝප වූ සිතින් මව දෙස බැලුවා  ඔරවා
වහලයෙ තිබූ ලණුවක් සුරතින්  දරුවා
තලමින් කඹෙන් අම්මා හෙම්බත් කෙරුවා

05. කෲරව ලැබූ ලණු පහරෙහි දරුණු  කම
මතු වී තිබුණි ඇගෙ සිරුරෙහි තැන  සෑම
දෙර ළඟ වැටී පැය ගණනක් යන  තුරුම
හැඬු හැටි ඇඳී ඇත මගෙ මතකයෙ  තවම

06. දිය පිරි කළය ඇය හිස මත  තබාගෙන
කිසිවක් නොදත් මා සුරතින්  දරාගෙන
එනවිට ගම මැදින් සිය නිවසට  යන්න
ආවා සපන්නට බල්ලෙක්  බුරාගෙන

07. බිහිසුණු හඬට මා බිය වී හඬන විට
හදවත උණුවුණා ඇයගේ දරු පෙමට
හිස මත කළය ගෙන අතහැරියා බිමට
අම්මා මෙමා සනසා ගත්තා කරට

08. සුරතල් වියේ පසු වෙන විට ජීවිතයේ
සිදු වූ දෙයක් තවමත් ඇත මගෙ සිහියේ
නගරයෙ රෝහලේ පාලුව තිබු කුටියේ
නිසසල ලෙසින් මව එහි වැතිරී සිටියේ

09. බලපන් චුට්ටො මේ උඹගේ මව කියලා
නෑයන් ඇගේ ඇඳ වෙත මා තල්ලු කළා
එනමුත් සිදුව ඇත්තේ කිමදැයි කියලා
මා හට වැටහුණේ තව බොහො කල් ගෙවිලා

10. මෙලෙසයි සිදුවුණේ අම්හිරි සිදුවීම
එනමුත් මකත නැත මවගේ රුව කෝම
අම්මා කියන තුන් අකුරේ ගුණ මහිම
අමතක නොවේ මගෙ පණ නල යන තුරුම

11. අම්මේ ඔබෙ නමට මම වඳිනෙමි සැමද
දුදනන් නිසා නොමඟට නොයනෙමි කිසිද
සුසුමෙන් දුකෙන් ගත වෙන ජීවිතය මෙද
කඳුළක් සැනසුමට හරවා ගමි මතු ද

12. සසරෙහි කළ පවට අම්මා අහිමි වුණා
සොයුරිය නිසා එය තරමක් මඟ හැරුණා
එනමුත් කුරිරු කර්මය තව දරුණු වුණා
මව මෙන් සිටිය සොහොයුරියත් අහිමි වුණා

13. සොයුරිය නිසා ලැබගත් ඒ සැනසීම
නැති වී ගියා හිරු දුටු පිණි බිඳු සේම
මවගෙන් සොහොයුරියගෙන් අහිමි වූ පෙම
වෙන ළඳකගෙන් කිසිද නොපතමිය මම

14. උපන් සැමට උරුමයි අට ලෝ දහම
වෛරෙන් වෛරෙ කිසිද නැත සැනසීම
සම්බුදු පියාණන් දෙසූ එඋතුම් දහම
මොනවට පෙන්වදෙයි ඇයගේ වැනසීම

15. මපියා මහ පියා හා එකමුතු වීලා
හේනක් කොටා සරුවට ඉඩමක් වවලා
ඒ මැද වැටක් සාදා වතු දෙක බෙදලා
සාමෙන් සමාදනෙන් ඇත දිවි ගෙවලා

16. ළග නිවසකට ඇති හිතවත්කම හන්ද
අඹ අහුලන්න අක්කා යනවලු සැම ද
එහි මව්තුමිය සිත තුළ නොසතුට රන්ද
පොළගෙක් වෙලා කන්නෙමි යැයි බැන වැදුනා

17. අක්කා සිනා සීගෙන ආපසු ආවා
එතුමිය කෙරෙහි කිසි වෙනසක් නොම පෑවා
උපතින් ගෙනා යහ ගුණයෙන් හද නාවා
සුපුරුදු විලසින් ම ඇගෙ දිවි මඟ පෑවා

18. මෙලෙසින් වසර ගණනත් ගත වෙලා ගියා
ලොකු මව පියා ගැන මතකය මැකී ගියා
සොයුරිගේ කල දවසත් ගෙවී ගියා
විවාහයක් වීමෙන් වෙනතකට ගියා

19. එගමේ සැම දෙනට ඇය හොඳ හිත පිදුවා
පින්වත් කුමරුවෙක් එහි දී ඇය ලැබුවා
සැමියත් සමඟ සතුටින් දිවි මඟ ගෙව්වා
තව දරුවෙකුට ඇගෙ කුස තුළ ඉඩ තැබුවා

20. හැටහතේ වරුසෙ නව අවුරුදු උද වුණා
අවුරුදු සැණකෙළිය නරඹන්නට සිතුණා
සැමියත් සමඟ එගමන යන්නට යෙදුනා
එනමුත් කර්ම බලවේගය හරස් වුණා

21. නගරෙට යන්න තිබු බස් එක මඟ හැරුනා
දෙවැනි බසය එන්නට කල් ගත වෙන්නා
සිතිවිලි රැසක් මනසට විත් වද දෙන්නා
කර්මය විසින් යා යුතු තැන් පෙන්වන්නා

22. සැමියා සමඟ වෙහෙසී වැව් තල හේන
බලාගෙන එන්න එම මොහොතේ සිතිණා
සැණකෙළි යන්න සැරසුණා ඇඳුම් සමඟින
සැමියා සමඟ දෙදෙනා හේනට ඇදින

23. බලා තල හේන සිත සොම්නස පිරුණා
ඉන් ලැබෙනා ඵලය දෙදෙනාටම පෙනුනා
අනාගතය ගැන බොහො දේ කතා වුණා
සොම්නස් සිතින් දෙදෙනා ආපසු හැරුණා

24. පෙර දින බැඳ තිබූ දර මිටියක් දැකලා
හිස මත තබා ගති ගෙනයන්නට සිතලා
හේනට ගියේ ඇය සැමියට පසු වීලා
ආපසු ආවෙ ඇය සැමියට පෙරටු වෙලා

25. ජීවිත ගමන සසරේ අති බියකරුය
සිදුවෙන්නට තිබෙන දෙය වළකනු බැරිය
පෙම් බස් දෙඩා දෙදෙනා ගියෙ ටික දුරය
හිටි හැටියේ ම බිම දැමුවා දර මිටිය

26. ඇය වේදනාවෙන් අඹරෙන්නට වූවා
සැමියා අරුමයෙන් විපරම් කර බැලුවා
අර ඇදෙනා සතා මගෙ පාදය සැපුවා
කියමින් සුරත පා සැමියට පෙන්වූවා

27. කිසි දිනයක නොදුටු මහ පොළඟෙකු දැකලා
සැමියා දර කඩක් ගෙන ආවා සොයලා
බැලුවා සැමත පොළඟා මරණට සිතලා
සැමියගෙ ඇස් වහලා උඹ ගොස් ඇත පැනලා

28. අවුරුදු සැණකෙළිය නරඹන්නටය කියා
මනමාලියක් විලසින් සැරසිලා එයා
කර්මය විසින් තල හේනට කැටුව ගියා
සැමියගෙ දෑත මත ආපසු ගෙදර ගියා

29. පොළඟා කෑව දින අඟහරුවාදය
දකුණු පාදයේ තැන බොලටා ඇටය
සිරුරෙහි වහා විශ දුව යන යෝගයය
දහසක් වෙදුන්ටත් සුව කළ නොහැකිමය

30. දක්ෂම විශ වෙදුන් කැඳවාගෙන ආවා
රෑ එළිවෙන තුරා විශ වෙදකම් යෙදුවා
වෛරයෙ විශ ගින්න ඒ සැම පැරදෙව්වා
අරුණෝදයේ ඇය අවසන් ගමන් ගියා

31. මව නැති පොඩි මල්ලි අමතක කර දමලා
පින්වත් කුමරුවෙක් මොලොවේ තනි කරලා
නෑ හිතවතුන් සැම සෝ සයුරේ දමලා
අක්කේ ඔබ ගියාදෝ සුර ලෝකෙ බලා

32. ඇයගේ අවසාන කටයුතු නිම කෙරුවා
වියෝ දුකින් දින ගණනක් ගත කෙරුවා
ක්‍රෝධෙන් බැඳුණ වෛරය නිම නොම කෙරුවා
ඊළඟ ඉලක්කය වූවා පොඩි දරුවා

33. ඇයගේ පුතා මිදුලේ සෙල්ලම් කෙරුවා
මේ රුදු සැපිනි ආවා සොයමින් දරුවා
කුමරුගෙ පුණ්‍ය බල මහිමය මතු වූවා
ඔහු වනසන්න නම් රුදු සැපිනිට බැරුවා

34. අල්ලපු නිවසෙ මිදුලේ මිනිසෙකු සිටියා
වෙන්නට යන විපත ඔහුගේ නෙත ගැටියා
හනිකට ඇවිත් රැක ගත්තා දරු පැටියා
මරණෙට පත් කළා ඔහු එපොලොන් තඩියා

35. මෙලෙසින් රුදු සසර ගැන බිය උපදවමි
කිසිවෙකුහටත් කිසි දින වෛර නොකරමි
සියලු සතුන් වෙත මෙත් සිත පතුරුවමි
දැහැමෙන් දිවි යවා සැනසුම ලබා ගමි

නිමි.

**කතු හිමිගේ පණිවිඩය:**

**අවි ගත්තෝ අවියෙන් ම නැසෙති. වෛර කරන්නෝ එම වෛරයෙන් තමා ම වැනසෙති. උඩු සුළඟට දැමූ දෙය තමා කරාම එන්නා මෙනි. මෙය ලොව පවතින සනාතන වූ දහමෙකි. බුදු දහමට අනුව අර්ථ සපයන වත්මන් සත්‍ය සිදුවීමකි. කාව්‍ය රසයෙන් හා සංවේගයෙන් නොනැවතී අර්ථය උකහා ගනිත්වා.**

# සෝ සුසුම්

01. රැහැයි හඬ නඟන බියකරු රුදුරු රැයේ
කණාමැදිරියන් ඉගිලෙයි තැන තැන එළියේ
පාලුව අඳුර මැද සිටිනා විට කුටියේ
මගෙ සිත දිව ගොසින් නැවතුනි අතීතයේ

02. සුරතල් වියේ පසුවෙන විට ජීවිතයේ
බියකරු චණ්ඩ මාරුතයක් හමා ගියේ
ලස්සන පුංචි පවුලක් අසරණ වූයේ
මනසට නැගි පුවත වැළලුන අතීතයේ

03. ගොඩ නැගූ අත්තිවාරම ඉරිතලා ගියේ
ශක්තිය රැඳුන කණු දෙක දෙදරලා ගියේ
එයින් එකක් පොළොවට වැළලිලා ගියේ
ශක්තිය නැතත් දුබලව තව එකක් තියේ

04. මේ කැණිමඬල යට ජීවත් වූ සුවයේ
ජීවිත පහක් අයියෝ අසරණ වූයේ
පිළිසරණක් කිසිවෙකුගෙන් නොම ලැබුයේ
ලෝ දම අනුවදේ මේ දෙය සිදු වූයේ

05. මේ පස් දෙනා අතරෙහි වැඩිමල් වූයේ
කයටම ඔබින නම මුතු මැණිකා වූයේ
විසඳන්නට ඉරණම තම ජීවිතයේ
දෑවැද්දක් නොමැතිව දීගයක ගියේ

06. ගිය ද ඉඳන් සැනසීමක් නැත ලැබුයේ
සැමියා සුරාවෙන් උම්මත්තක වූයේ
දෑවැදි ඉල්ලලා සැමියා මොර ගෑයේ
ගුටි බැට බැනුම් සැමියාගෙන් හිමි වූයේ

07. ජීවිත රකින්නට ඇය වී තම්බන්නා
සැමියා සහල් ගෙන වෙළඳමේ යන්නා
සවසට සතර ගාතෙන් ගෙදරට එන්නා
කඳුළුයි බතුයි ඇය රස කර කර කන්නා

08. දරුවන් පස් දෙනෙකි මෙහි දී ඇය ලැබුයේ
වැඩිමල් පුතා අකලට මරු තුළට ගියේ
අනෙක් පුතුන් උන්ගේ පියා අනුව ගියේ
ඒ මුතු මැණිකා ගෙයි දසිය මෙන් වූයේ

09. දෙදරූ කැණිමඬල යට දෙවෙනිය වූයේ
රූබර තරුණියකි සෝමාවති වූයේ
පියකරු වන මලක් මෙන් විකසිත වූයේ
ගතටත් වැඩිය හදවත් ලස්සන වූයේ

10. පාලු නිවසෙ මිණි පහණක් මෙන් වූයේ
මව් නැති සොයුරන්ට මව් සෙනෙහස පෑයේ
විසඳන්ට ඉරණම තම ජීවිතයේ
දිරි ඇති ස්වාමියෙකි සහවාසෙට ආයේ

11. අඳුරු ගෙයට නව ආලෝකයක් දෙමින්
පිරිහුණු තැන් වසා දියුණට වැඩ සදමින්
වතුපිටි කුඹුරු සකසා තව සරු කරමින්
කටයුතු ඇරඹුවා ඔහු දහිරිය වඩමින්

12. ඉසි කෝ මද මානයෙන් හදවත දල්වා
දුර සිටි නෑ කෙනෙක් මේ නිවසට ආවා
දියුණට වැඩ සැදෙනු ඇය නොම ඉවසූවා
සතුටින් තිබූ හදවත් ගිනි දැල්වූවා

13. බලාපොරොත්තුවේ සටහන් මැකී ගියා
ඉවසුමෙ සීමාව ඉන් දෙදරලා ගියා
දිරි ඇති සැමියා ඔහුගේ නිවසටම ගියා
සොයුරන් අතැර අක්කත් ඔහු සමඟ ගියා

14. සොයුරන් තුන් දෙනා නිවසේ තනි      වූයේ
වැඩිමල් දෙදෙන දැන් තරමක් තරුණ      වියේ
යහමඟ යවන්නට කිසිවෙක් නැති      වූයේ
නිවසින් පිටවමයි සිටියේ දිවා      රැයේ

15. මේ පස් දෙනා අතරෙහි බාලය      වූයේ
ඔහුටම ගැලපෙනා නම චුට්ටා      වූයේ
කිසිවෙක් නැතිව ඔහු නිවසේ තනි      වූයේ
ටයිගර් පමණි ඔහුගේ තනියට      සිටියේ

16. ළමා වයස මලකට උපමා      වූයේ
මේ පොඩි ළමා මල නැත විකසිත      වූයේ
ආලෝකයෙ මඟක් නැත තව හමු      වූයේ
පාලුව අඳුර මැද ජීවත ගෙවී      ගියේ

17. උදෑසනින් නැගිටී ගෙමිදුල්      අමදියි
පිටුපස ඉරුණ කලිසම සහ කමිසෙ      අඳියි
අඩු මුදලකට ගත් පරණ වු පොත්      මිටියයි
තුරුළු කරන් උදයෙම පාසලට      දුවයි

18. පෙරවරුවේ පාසල ඉගෙනීම      ලබයි
කුසගිනි උසුලමින් දහවල් නිවසට      එයි
පොත පත පෑන ගන්නට මුදලුත් හිඟ      වෙයි
හෙළ ඔසු විකුණලා සුළු මුදලක්      උපයයි

19. බාධක මැදින් ඔහු ඉගෙනුම කරන්      ගියා
ගුරු සිසු සැමගෙ සිත් දිනා ඉදිරියට      ගියා
සෙනසුරු රාහු දෙදෙනා උරණ වී      ගියා
කර්මය අනුව ජීවිතෙ කරකැවී      ගියා

20. වසරින් වසර පන්තිය ඉහළට      යන්නා
ඒ අයුරින් ම වයසත් මුහුකුරා      යන්නා
ඉගෙනුම ලබන්නට අවහිර වැඩි      වෙන්නා
සෝ සුසුමින් පාසල් මඟ නිම      වෙන්නා

21. උපන්නොත් ලොවේ සිදු වෙයි දිවි රැකුම
මැරෙනා තුරුම සිදුවෙයි කටයුතු කෙරුම
පිය පරපුරෙන් ඔහුටත් ලැබුනේ උරුම
බාලේ පටන් පුරුදුයි ගොවිතැන් කෙරුම

22. කැලයක් කපා එහි තල හේනක් වවලා
වැට කොටු බැඳන් තව තව ගොවිතැන් කරලා
නිවෙසක් තනා මතු දිවි රැකුමට සිතලා
කටයුතු ඇරඹුවා ඔහු වීරිය යොදලා

23. තුන් පැත්තකින් ඉඩමේ නෑයන් විසුවා
ඉඩම නිසා නෑයන් විරසක වූවා
එම හේතුවෙන් ඔහුගේ සිත කළ කිරුවා
ගම හැරද යන්න මේ විලසින් සිතුවා

24. මහ පොළොවකට ඇයි මේ හැටි වළි කන්නේ
පරලොව යනදට මොනවද ගෙන යන්නේ
නෑයන් සමඟ ඇයි මා විරසක වන්නේ
සිතමින් ගමෙන් පිට වී නගරෙට යන්නේ

25. කර්මය අනුව සිදු විය යුතු දෙය වෙන්ට
රැකියාවක් සොයා ආවා නගරයට
ධනපතියන්ට යට වී වැඩ කරන්නට
ඉන් පසු සිදු වුණා ජීවිතෙ රැක ගන්ට

26. මිනිස්කම් නොමැත මිනිසුන් තුළ ඇත්තේ
වස්තුව සෙවුම මයි මුල් තැන වී ඇත්තේ
විශම සමාජයෙ තතු ඉන් දැන ගත්තේ
සිතුවා මෙලෙස සැනසුම කොතැන ද ඇත්තේ

27. තුන් ලෝ තිලක අපෙ සම්බුදු පියාණන්
ලෝ සත වෙතට දෙසු දම් මඟ දයාවෙන්
ඒ මඟ ගියොත් බුදු සසුනට පිවිසීමෙන්
හැකි වේ සැනසෙන්ට දුක් රැස නිම වීමෙන්

28. සූ විසි වසක් ගෙවුවා ජීවිත ගමන
දැන් ඔහු බලනවා නිරතුරු බුදු සරණ
දැන්වීමක් තිබුණි එහි ඇටමැස අරණ
ඉන් පසු ගියා සොයමින් තිසරණ සරණ

29. මෙලෙසින් ගිහි දිවිය ගැන ඔහු කළ කිරුණා
නගරෙත් ගමත් දෙක ඔහුහට එපා වුනා
විශම වු සමාජෙන් සමුගන්නට සිතුණා
ගිහිගෙය හැර දමා ගොස් ඔහු පැවිදි වුනා

30. මැරෙනා තුරු පමණි මේ ලොව කියුම් කෙරුම්
තිබෙනා තුරු පමණි පස් කඳ සෙවුම් බැලුම්
නිවෙනා තුරු සෙවිය යුතු වේ උතුම් දහම්
ඉන් පසු නිමා වේ හද තුළ සෝක සුසුම්

නිමි.

**කතු හිමිගේ පණිවිඩය:**

**ලාභ, අලාභ, යස, අයස, නින්දා, ප්‍රශංසා සැප, දුක යන අටලෝ දහම නිරතුරු ක්‍රියාත්මක වේ. ලොවට අයත් සත්වයෝ හොඳ, නරක, පව්, පින් කරති. ඒ අනුව ඔවුන් තුළ කර්ම රැස් වේ. විපාක පසු පස පැමිණ ඉඩ ලැබුන තැන ඵලදීම වේ. අදහම දුක ඇති කරයි. සදහම සැප ඇති කරයි. ඒ දෙක ම අස්ථිර ය. සැනසුම් මග හා සැප දුක් දෙක ම නැති නිවන ස්ථිර යි.**

# ඇටමැස්ස කන්ද

01. සියලු සිරින් සපිරුණ සිරි ලංකා පුරේ
දකුණු ලකේ අග නගරය ගාලු පුරේ
සිටන් අඩ යොදුන් ගිය තැන නැගෙන හිරේ
නමින් අඟුලුගහ නම් විය මෙපුර වරේ

02. ගාලු පුරේ සිට අකුරැස මඟ ඔස්සේ
සැතපුම් අටක් දුර ගොස් බසයෙන් බැස්සේ
පෙරගිර දෙසට වමතට ඇති මඟ ඔස්සේ
තව සැතපුමක් පා ගමනින් යමු සිත් සේ

03. කඳු හෙල් වන වදුල් මහ බෑවුම් අස්සේ
නිල්වන් ලෙසින් බබලන වෙල් එළි දිස්සේ
සියොතුන් සැරිසරයි නිරතුරු මෙහි සිත් සේ
රැහැයින් හඬනගයි දිව රෑ ගස් අස්සේ

04. අඩියෙන් අඩිය ඉහළට පියවර මැනුනේ
නිල්වන් කඳු පේළිමයි සැමතින් පෙනුනේ
මේ කඳු බෑවුමේ මනහර හිම අරණේ
අමුතුම සහන් සුවයකි මසිතට දැනුනේ

05. අසරණ සා මුවන් සිත් සේ හැසිරෙනවා
විහඟුන් තුරු අතර ගී නද පතුරනවා
මී මැසි බඹර කැල ගුම් ගුම් නද දෙනවා
අමුතුම මිහිරියාවක් හද පිනවනවා

06. කසාවත්වලින් සිය ගත වෙලාගෙන
විය දඬක් පමණකින් බිම බලාගෙන
සොම්නසින් නිතොර මුව කමල සරසන
සඟ රුවන දුටිමි මෙහි පියවර මනින

07. බොදු දනන් පැමිණි කළ දන් බෙද දෙන
පිළිවෙළින් වඩිනවා ඒ සඟ රුවන
පඩිපෙළින් පැමිණ සන්සුන් විලාසෙන
කුටිවලට වඩිනවා පිඩු සිඟාගෙන

08. දිනකර උදවෙයි සැමද අරුණෝදේ
දස අත සිසාරා යයි සදහම් නාදේ
බොදු දනන් ඇදෙයි මේ පියසට නිබඳේ
මනහරයි දසුන් සිරි ඇටමැස කන්දේ

09. කම් සුව අතැර සොයමින් සුව නිරාමිස
මන් සන්තොසින් පුරමින් තම පැවිදි කිස
දන් දෙන්නවුන් හට බෙදමින් දහම් රස
උන් සඟ රුවන දැකුමෙන් නිවුනා මනස

10. දවමින් මෙසත් වග නිති එකොළොස් ගින්නෙන්
භවයෙන් භවය දුවනා මේ රුදු සසරෙන්
ගැලවෙන්නට සිතා සරමින් පැවිදි වෙසින්
බුදු පුතුන් නිතොර නමදිනවා තෙරුවන්

11. පුදබිමේ තෙරිඳු සඳ සද්ධා නන්ද
දහ අටක් සිසුන් යුත් සඟ රුවනින්ද
සිවු දෙසේ දනන් බැතියෙන් හද බැන්ද
සිරිලකේ එපින් කෙත ඇටමැස කන්ද

12. දිව රෑ වෙහෙස වී සසුනට වැඩ සැදුයේ
හතළිස් හත් වසකි එතෙරිඳු වැඩ සිටියේ
ව්‍යාධිය විසින් නොසිතුව ලෙස වැඩ යෙදුයේ
මහා බලැති මරු වසඟට වැඩම වුයේ

13. දිනිඳු ඇති කලට ලොව එළියෙන් බබලයි
තරිඳු අහස මැද තරු කැල හා බබලයි
තෙදැති තෙරුඳු නැති ද පුදබිම අඳුරැයි
නවක පැවිදි සිසු කැල ඉන් අසරණ වෙයි

14. අරණා එකලු කල ගිනි කඳ නිවී ගියා
කණාමැදිරියන් තැන තැන විසිරිලා ගියා
රොන් රස උරන බඹරුන් නැති වෙලා ගියා
ලෝ දම අනුව පින්කෙත නිසරු වී ගියා

15. මෙම පුදබිමට යන එන සැදැහැති කවුරු
මහ සඟ රුවන වෙත පුද කෙරුවා සිවුරු
එම පිදු සිවුරු අද පොරවන්නේ කවුරු
පණ නැති ගස් ගල් ද පොරවයි එම සිවුරු

16. මේ පුද බිමට ගැලු සදහම් ආලෝකේ
පැතිරී සැමත තිබුණා මේ දකුණු ලකේ
සදහම් මිහිර රැඳි ඒ අරුණා ලෝකේ
වියැකී ගොසිනි මෙන් හිරුගේ ආලෝකේ

17. උදයේ හවස ඇසුණා සදහම් රාවේ
පෙදෙසම ගිගුම් දුනි පිරිතේ අනුරාවේ
වියැකී ගොසින් ඇත අද ඒ මිහිරාවේ
පාලුව අඳුර මිස නැත සදහම් රාවේ

18. සිතු දේ නොවී නොසිතුව වේ සිතුම් පැතුම්
මැරෙනා තෙක් පමණි මේ ලොව කියුම් කෙරුම්
ඇති වූ ලෙස ම නැති වේ ලොව විලස දහම්
අනිසයි තුන් ලොවේ පවතින සකර දහම්

නිමි.

**කතු හිමිගේ පණිවිඩය:**

**අනිත්‍යතාවය ලොව පවතින්නා වූ සනාතන දහමකි. එය කොතනටත්, කාහටත් පොදු ය. ඇතිවීම, ඇති තැන, නැති වීම ද ඇත. වෙනස්වීම ළඟ දුක හා අසාර බව ද පවතී. මෙය අවබෝධ කළ යුතු ය.**

# මව් පිය ගුණ වරුණ

01. සම්මා සම්බුදු සමිඳුට සිරසින් නමදිම්මා
නීයානික දහම වෙතට සිත් යොමු කරනෙම්මා
බුද්ධ පුත්‍ර සඟ රුවනට බැතියෙන් නමදිම්මා
තෙරුවන් වැඳ මව් පිය ගුණ වරුණ ද පවසම්මා

02. දසමසක් ම කුසේ දරන් මහ දුක් විඳි අම්මා
ඝෝර කටුක දුක් ඉවසා ලොව දැක් වූ අම්මා
මිහිරි රසැති කිරි පොවමින් කුසගිනි නිවි අම්මා
සියලුම දුක් නැති වීලා සැනසේ ලොව අම්මා

03. තුන් ලෝකෙට උතුම් වුනේ අපේ සම්බුදු පියා
තුන් ලොවටම පිහිට වුණේ අපෙ තිලොවග පියා
දූන් පුතුන් වෙනුවෙන් නිති වෙහෙස වුනේ පියා
තුන් සරණේ ගුණ බලයෙන් සැනසේවා පියා

04. මගේ පුතුට බුදු සරණයි කියා පැතුවෙ අම්මා
දම් සරණයි සඟ සරණයි කියා පැතුවෙ අම්මා
දරුවන් හට දෙවි පිහිටයි කියා පැතුවෙ අම්මා
මෙත්තා බඹ විහරණයෙන් සැනසේවා අම්මා

05. දරුවන් හට සැප දෙවන්න පිහිට වුනේ පියා
දරුවන් වෙනුවෙන් තම සැප අතහැරියේ පියා
දරුවන්ගේ සැනසීමට මඟ සැදුවේ පියා
මෙත්තා ගුණයෙන් ම ලොවේ සැනසේවා පියා

06. ලෙඩක් හැදුණ විට දි පුතුට ශෝක කළේ අම්මා
විපතක් දැක දරුවන්ගේ කම්පා වුනේ අම්මා
දුක් කරදර පැමිණෙනු දැක කම්පා වූ අම්මා
කරුණා බඹ විහරණයෙන් සැනසේවා අම්මා

07. අසරණ දරුවන් දැකලා කම්පා වූ පියා
විපතක් දැක දරුවන්ගේ හද උණු වූ පියා
දුක් කරදර නොම වෙන්නට මඟ සැදුවේ පියා
කරුණා ගුණයෙන් ම ලොවේ සැනසේවා පියා

08. දරු සුරතල් බලමින් නිති සතුටු වුණේ අම්මා
වැඩෙනා දරුවන් දැකලා සතුටු වුණේ අම්මා
සැපවත් වූ දරුවන් දැක සතුටු වුණේ අම්මා
මුදිතා බඹ විහරණයෙන් සැනසේවා අම්මා

09. දරුවන් දෙස බලා නිතර සතුටු වුණේ පියා
දරුවන්ගේ දියුණුව දැක සතුටු වුණේ පියා
තම සම්පත් බෙදා දෙමින් සතුටු වුණේ පියා
මුදිතා ගුණයෙන් ම ලෝවේ සැනසේවා පියා

10. දරුවන්ගෙන් පැමිණෙන දුක් ඉවසූ මව්පියෝ
සැප සම්පත් දරුවන් හට පැවරූ මව්පියෝ
නොසැලකුවත් සිය දරුවන් මැදහත් මව්පියෝ
උපේක්ෂාව දියුණු වෙලා සැනසේ මව්පියෝ

11. මහා බ්‍රහ්ම ආචාරිය ගුණ දැරූ මව්පියෝ
පුබ්බදේව ආහුණෙය්‍ය ගුණ ඇති මව්පියෝ
උදේ සවස වැඳුම් පිදුම් කළ යුතු මව්පියෝ
මහලුමඩම් වෙත යවමු ද දරුවෙනි මව්පියෝ

12. ගත වීරිය ඇති කළ දරුවන් රැකි මව්පියෝ
තම යුතුකම් නොපිරිහෙලා ඉටු කළ ු මව්පියෝ
සිත දුබලව ගත වැහැරී මහලු වූ මව්පියෝ
රැක ගත යුතු නොවෙද ඉතින් දරුවෙනි මව්පියෝ

13. අපමණ දුක් වෙහස දරා අප හැදු මව්පියෝ
අප වෙනුවෙන් සිය ජීවිත කැප කළ මව්පියෝ
අපමණ මෙත් කරුණා ගුණ පතුරන මව්පියෝ
ඉටු දෙවියන් සේ සලකමු දරුවෙනි මව්පියෝ

14. බුදු වෙන්නට සිය පුතු හට විවරණ දුන් අම්මා
බුදු පුතෙකුට මව් වෙන්නට පැතුම් පැතුවෙ අම්මා
බුදු සසුනට පිහිට වෙන්න පෙරුම් පිරුවෙ අම්මා
බුදු පුතෙකුව බිහි කරලා ලොව සැනසුවෙ අම්මා

15. අම්මා යන උතුම් පදේ රැව් දේවා මුවින් මුවේ
අම්මාගේ ගුණ රාවය පැතිරේවා මෙතුන් ලොවේ
අම්මාවරු දරුවන් හට ලැබදේවා දහම් සුවේ
අම්මාවරු සැනසේවා අජරාමර නිවන් සුවේ

16. ඉපදුන ද පටන් දරුවන් වඩන නියා
සිය ගත ඩහදියෙන් දෙරණාත තෙමී ගියා
ගත සිත සැනසිල්ල සැමද අතැර පියා
අප වෙනුවෙන් ය වෙහෙසුනේ රත්තරන් පියා

17. දෙඅත පුරා කරගැට මතුවෙලා ගියා
පතුල පුරා දෙපයේ ඉරිතලා ගියා
සිරුර පුරා ඩහදිය වැගිරිලා ගියා
දේත පුරා දුන්නේ දරුවන්ට පියා

18. නොයෙක් දුක් වෙහෙස විඳ අප හැදුව පියාණෙනි
සෙනෙහසින් මිහිරි කිරි අපට පෙව් මෑණියනි
දහම් සිසිලෙන් සසර දුක් ගින්න නිවමිනි
නිවන් සුව ලැබ ගන්න මෑණියනි පියාණෙනි

19. මව්පියෝ හැර බුදු සසුනේ පැවිදිවු දරුවෙකි
බුදු පුතෙකුව සිය මව්පියො රැකගත් දරුවෙකි
මව්පියො රැක නිවන් සුවය ලැබගත් පුවතකි
මෙතැන් පටන් ඒ කතාව අහන්නකො සකි

20. වරම් ලබා බුදුවෙන්නට පෙරුමන් පිරුවෝ
භවෙන් භවේ රැක ගත්තා බෝසත් මව්පියෝ
මරු පරදා ඒ බෝසත් බුදු බව ලැබුවෝ
මව්පියන්ගෙ ගුණ වරුණය ඒ හිමි දෙසුවෝ

21. සිටිනා විට අපෙ බුදු හිමි දෙවුරම් වෙහෙරේ
දෙසනා දම් හඬ සැමද දස අත පැතිරේ
යනෙනා සැම දෙනගේ සිත් සතුටින් ඉතිරේ
අසනා සැමදෙන යනවා දෙවුරම් වෙහෙරේ

22. අසූ කෙළක් වස්තුව ඇති එසැවැත් නුවරේ
මව්පියො දෙපළක් වසනවා මහ සිටු මැඳුරේ
ඔවුනට ඇති එක ම පුතෙක් ගුණයෙන් සපිරේ
දකිනව ඔහු යනෙනා අය දෙවුරම් වෙහෙරේ

23. සැමද මේ සියලු දෙනා කොයිබද යන්නේ
විඳිනා සතුටිනි සැමදෙන ආපසු එන්නේ
පෙනෙනා සැම මුහුණෙම සොම්නස ඉතිරෙන්නේ
සිතුනා සිටු පුතු හට මේ ගැන විමසන්නේ

24. පින්වත පින්වතිය මා හට වෙන්න සමා
යන්නට ඇතත් ඔබ සැමහට නොවී පමා
ඉන්නට සිතුනෙ දැන ගන්නට මෙයම තමා
යන්නට යන්නෙ කොයිබටදේ මේ සැවොමා

25. තුන් ලෝ තිලක අපෙ සම්බුදු පියාණන්
පෙන්වා නිවන් ගොඩලවමින් භව සයුරෙන්
ඉන්නා බව නොදනී ද සදහම් දෙසමින්
දන්නා සැවොම යන්නේ අසනට සදහම්

26. පස්කම් සැප විඳින අය මහ මැඳුරුවල
ගොස් බණ අහනවද බිම ඉඳ දහම් හල
සිස් නොව පාරමී පිරි ඇති එසිත තුල
ගොස් විඳ ගන්න සිතුනා සදහම් සිසිල

27. යනවා පෙළ ගැසී බණ ඇසුමට සුදනන්
බොනවා ගිනි වතුර නොගොසින් ඉඳ දුදදන්
පිනවා සවන් අමරස සදහම් දෙසමින්
එනවා එසිටු පුතු වෙත සම්බුදු සමිඳුන්

28. මහජන ගඟින් දෙව්රම් වෙහෙරම පිරුනා
මහ මැදුරෙන් පැමිණ බිම ඉඳ දම් අසනා
මහ කුලුනෙන් යුතුව සත වෙත දම් දෙසනා
මහ සත් හිමියන්ට ඒ සිටු පුතු පෙනුනා

29. පිළිවෙල කතාවෙන් සැම සිත් පහදවමින්
දිවියේ නොතිර බව බඹසර ගුණ වනමින්
භවයේ අනිස තිලකුණු පෙන්වා දෙවමින්
දෙසුවා දහම් සිවුසස් සම්බුදු සමිඳුන්

30. අසා දහම් සිටු පුතුගේ සිත නිවුනා
එසා මහත් සැප සම්පත් එපා වුනා
නිසා නොතිර බව දිවියේ කළ කිරුණා
වසා සසුන බඹසර රැකුමට සිතුනා

31. ගිහි ගෙය ගිනි ගෙයක් විලසින් වැටහෙන්නේ
ගිහි බව රුදුරු සසරටමයි දිව යන්නේ
සිහි නුවණින් යුතුව ඔහු දැන් පසුවෙන්නේ
බණ ඇසු පිරිස සැම දෙන පිට වී යන්නේ

32. දෙව්රම් වෙහෙර ජනයන්ගෙන් හිස් වෙනවා
සම්බුදු පියා දම් අසුනෙම පසු වෙනවා
දෙලොවක් අතර සිටුපුතු දැන් තනි වෙනවා
කළ යුතු දෙයක් ඔහුගේ මනසට එනවා

33. ඔහු විගසින් ගොසින් බුදු හිමි පා වැඳලා
මේ ලෙස කියනවා බැතියෙන් දණ නමලා
හිමියනි දහම් ඇසුවා මම් මෙතෙක් වෙලා
සිතුවා පුරන්නට බඹසර මහණ වෙලා

34. සමුබුදු පියාණෙනි මහ කරුණා වන්ත
ඇසූ පසු දහම් මට බැහැ ගිහිගේ ඉන්න
සංසාරයේ දුක් රැස සිඳ බිඳ ලන්න
පැවිදි කරනු මැන බඹසර සුවසන්න

35. බුදු හිමි පැවසුවා මේ ලෙස සිටු පුතුට
පිංවත් ගිහි දරුව හොඳ හැටි අහ ගන්ට
මව්පියො සිටිනවද ඔබ හට විමසන්ට
ඔබෙ මව්පියන්ගෙන් අවසර ඉල්වන්ට

36. මව්පිය අවසරය නොමැතිව ගිහි දරුව
මහණ කරනු බැහැ අප හට එය දනුව
ලැබගෙන අවසරය ආවොත් නම් දරුව
දෙන්නෙමි ඔබට බුදු සසුනෙහි පැවිදි බව

37. මා හට දහම් දෙසු සමිඳුනි මන නන්ද
මව්පියො සිටිනවා මා හට ඒ හන්ද
මව්පියො කැමති කරවා අවසර කැන්ද
විගසින් ගොසින් එන්නෙමි ඔබ පා වැන්ද

38. සොම්නස් සිතින් සිටු පුතු ආපසු යනවා
විමසිලි නෙතින් ගෙයි මව්පියො පසුවෙනවා
කුහුලක් ඔහු කෙරෙහි ඔවුනට ඇතිවෙනවා
ආ ගිය තොරතුරුත් පුතුගෙන් විමසනවා

39. අම්මේ තාත්තේ එහෙනම් අහ ගන්ට
මම් අද ගියේ සම්බුදු සමිඳුන් ලඟට
හොඳ දහමක් ඒ හිමි දෙසුවා මෙමට
දැන් මට නොහැක මේ ගිහි ගේ තුළ ඉන්ට

40. වඳිනෙමි ඔබෙ දෙපා අම්මේ පියාණනේ
දිවියේ අනිස අද හොඳ හැටි මට දැනුනේ
දුක් නැති සැප ලබන මඟ ඇත බුදු සසුනේ
ගිහි ගෙය හැර දමා යන්නට මට සිතුනේ

41. එකොළොස් ගිනි නිවා සැනසුම ලැබ ගන්ට
මේ රුදු ඝෝර සසරින් එතෙරට යන්ට
සම්බුදු සසුනෙ මඟ බඹසර සුවසන්ට
අම්මේ තාත්තේ මට අවසර දෙන්ට

42. අපගේ එකම දරුවා ඔබ නොවෙ ද පුතේ
මේ ගෙයි සියලු සම්පත් ඔබ හටයි පුතේ
ගිහි ගේ ඉඳන් ගුණ දම් සපුරන්ට පුතේ
මහණ වෙන්න නම් ඉඩ දිය නොහැක පුතේ

43. ගිහි සම්පත්වලින් කිසි ඵලයක් නැතිනේ
සැම දෙය හැර දමා පරලොව යා යුතුනේ
මරුවා පැමිණි කළ අම්මේ පියාණනේ
වළකනු බැරිය ඔහු සමගින් යා යුතුනේ

44. එදිනට කෙළෙසක ද ඔබ මා වළකන්නේ
ලොව කිසි කෙනෙක් නැත ඒ මරුගෙන් මිඳුනේ
ඔබලා වෙතත් ඒ රුදු මරුවා එන්නේ
නොදනිමි ඔබ ද මා දැයි ඉස්සර වෙන්නේ

45. පිදුවොත් තම පුතෙක් බුදු සසුනට ඉතිනේ
මව්පියො කොටස්කරුවන් වෙයි බුදු සසුනේ
එම බුදු පුතා අම නිවනෙන් සැනසෙන්නේ
මව්පියො සැමත් භව කතරින් ගොඩ වෙන්නේ

46. පෙන්වා කරුණු මව් පියනට එසිටු පුතා
මේ රුදු ඝෝර සසරින් ගොඩවෙන්න සිතා
ලැබ අවසරය මව්පියනගෙ තුටින් ඉතා
යනවා මහණ වෙන්නට ඒ පිනැති පුතා

47. ගිහි ගෙය ගිනි ගෙයක් විලසින්මයි දැනුනේ
දිවියේ නොතිර බව බුදු දහමින් පෙනුනේ
ලැබ සැනසෙනු පිණිස දුක් නැති අම නිවනේ
බුදු සමිඳුන් වෙතට ගොස් ඔහු පැවැදි වුනේ

48. විසුවා ටික කලක් එම දෙව්රම් වෙහෙරේ
එනවා ඥාති පිරිවර වෙහෙරට නිතොරේ
වෙනවා බාධකය නිවනේ මඟ ඇහිරේ
යනවා එහිමි නොවසා දෙව්රම් වෙහෙරේ

49. දුර පෙදෙසෙකට ගොස් සිත සන්සුන් කෙරුවා
මරු ජය ගන්න නිරතුරු විදසුන් වැඩුවා
කාලය නොනැවතී ඉදිරියටම දිව්වා
වස් ගණනකුත් ඒ හිමි දැන් පසු කෙරුවා

50. මහ සිටු මැදුරට ම සිටියේ එක ම පුතයි
ඒ මහ සම්පතට හිමකරුවා ද ඔහුයි
ඒ සිටු පුතා බුදු සසුනෙහි බවුන් වඩයි
මහ සිටු යුවල ඒ මහ මැදුරෙහි තනිවෙයි

51. පුතු වෙනුවෙන් මෙතෙක් මව්පියො වෙහෙස වුණා
ඔහු වෙනුවෙන් ම ධන සම්පත් තර කෙරුනා
ඒ එක පුතා බුදු සසුනෙහි පැවිදි වුනා
වස්තුව ධනය ඉන්පසු නොම රැස් කෙරුනා

52. ඇති වස්තුව දිනෙන් දින ගෙවී ගෙවී ගියා
වැඩකරුවන් අතට ගත් දෙය අරන් ගියා
ණයකරුවන් ණය ආපසු නොදී ගියා
ඒ සිටු යුවල මෙලෙසින් දිළිඳු වී ගියා

53. කෝටි ගණන් වස්තුව පිරිහී යනවා
වතු පිටි කුඹුරු ක්‍රමයෙන් විකිණී යනවා
නෑදෑ හිතවතුන් දැන් නොබලා යනවා
අවසන සිටු ගෙයත් උගසට විකිණෙනවා

54. තව කාලයක් මේ ලෙස ජීවිත ගෙවුනා
වයසත් මුහුකුරා ගත සිත දුබල වුනා
ගෙය විකුණූ මුදල් කා බී ඉවර වුනා
සිටු ගෙය උකස්කරුවන් හට සින්න වුනා

55. කළ හැකි කිසි දෙයක් ඔවුනට නැති වෙනවා
සිටු මැඳුරෙන් අහෝ දෙදෙනම පිට වෙනවා
අට ලෝ දහම කාටත් ලොව පොදු වෙනවා
මහලු වූ සිටු යුවල දැන් සිඟමන් යනවා

56. ගෙන් ගෙට ඇවිදිමින් සිඟමන් ඉල්වනවා
ලැබෙනා දෙයින් දෙදෙනා ජීවත් වෙනවා
ගත වෙලි ඇඳි වතත් වැහැරැලි වී යනවා
හිරු නැති වෙලේ අම්බලමක සැතපෙනවා

57. ඔවුනගේ පුතා මේ කිසිවක් නොම දන්නේ
දුර සෙනසුනක සිට ගුණ දම් සපුරන්නේ
වෙන හිමි නමක් සැවැතින් එතැනට යන්නේ
ඒ හිමියන් වෙතින් තොරතුරු විමසන්නේ

58. සම්බුදු පියාණන් සුව සේ වෙසෙනව ද
අගසව් මහා සව් නිදුකින් සිටිනව ද
සබ්රම්සරුන් මැනවින් ගුණ පුරණව ද
දෙව්රම් වෙහෙරෙ තොරතුරු මට කියනව ද

59. එසැවැත් පුරේ අසවල් වීදිය පැත්තේ
අසවල් තැනෙක මහ සිටු මැදුරක් ඇත්තේ
මහ සිටු යුවලගේ දැන් පවතින තත්තේ
ඔබ දන්නා විලස මා හට කිව යුත්තේ

60. ආගන්තුක එහිමි තොරතුරු ගෙන ගලපා
දෙව්රම් විහාරේ ඇති තතු ගෙන හැර පා
මේ ලෙස කියනවා මෙත් කරුණාව පපා
ඒ සිටු පවුල ගැන තොරතුරු අසනු එපා

61. ඇයි හිමියනේ ඔබ මේ ලෙස පවසන්නනේ
ඒ සිටු පවුල ගැනමයි මා විමසන්නේ
ඔබ දන්නා පරිදි එහි තතු විලසින්නේ
දැනගනු කැමති මට ඒ සැම පවසන්නේ

62. එහෙනම් ඒ පුවත හොඳ හැටි අහගන්න
අට ලෝ දහම එතුළින් හැක දැන ගන්න
එපුවත අසා සංවේග උපදන්න
භවේ අනිස දැක භවයෙන් ගොඩ වෙන්න

63. ඔවුනට සිටියාලු පින් ඇති එක ම පුතෙක්
සසරට කළකිරී ලැබගෙන පැවිදි බවක්
ගුණදම් පිරුවාලු ලැබුමට සැනසීමක්
කවුරුත් නොම දනී ඔහු දැන් සිටින තැනක්

64. දරුවා නැතිව මව්පියො ඇත තනි වීලා
වස්තුව සෙවුම ඉන්පසු ඇත නැවතීලා
කෝටි ගණන් ධනයක් අවසන් වීලා
මහ සිටු යුවල අයියෝ දැන් දිළිඳු වෙලා

65. ගේ දෙර ඉඩකඩම් සැම දෙය විකිණීලා
ඇඳි වත පමණක් ම දැන් ඇති ඉතිරි වෙලා
නෑ හිතවතුන්ගේ පිහිටක් නැත ලැබිලා
හිඟමන් යදිනවා අම්බලමකට වෙලා

66. මෙපුවත අසා හදවත කම්පා වෙනවා
පුතු හිමියන්ගේ දෙනෙතින් කඳුළැලි එනවා
ආගන්තුක හිමිට කුහුලක් ඇති වෙනවා
හිමියනි අඬන්නේ ඇයි දැයි විමසනවා

67. ඔබ ඔය කියන සිටු යුවලගෙ එකම පුතා
සසරින් මිදී නිවනින් සැනසෙන්න සිතා
ලැබගත් මහණකම සසුනේ දුකින් ඉතා
ඔබ ඉදිරියේ හිඳින මම වෙමි එබුදු පුතා

68. මේ හමුවීම නම් හිමියනි හරි පුදුමයි
මව්පියො රැක ගැන්ම දරුවන් හට නියමයි
ඔබෙ මවුපියන් හට දැන් නම් දුක උරුමයි
ඒ අය රැක ගැන් ම හිමි ඔබෙ යුතුකමමයි

69. ඒ බව මා හටත් හොඳ හැටි වැටහෙනවා
ඒ ගැන සිහිව මගෙ සිත කම්පා වෙනවා
මේ සෙනසුන ඔබට හිමියනි පවරනවා
මා දැන් මව් පියන් රැක ගැනුමට යනවා

70. පවරා එසෙනසුන ආගන්තුක හිමිට
බටුවා සැවැත් පුර යන්නට මහ මඟට
ළංවෙයි මඟ ගෙවා තුන් මං හන්දියට
පසුවේ කල්පනාවෙක හිමි එතැන් සිට

71. මේ මඟ ගියොත් හමුවේ දෙව්රම් වෙහෙර
සම්බුදු පියා ඇත ගඳ කිළියේ පවර
අන් මඟ ගියොත් හමුවේ එසැවැත් නුවර
මව්පියො සිටින අම්බලමක් ඇත නුදුර

72. වසතොත් සසරෙ මවුපියො නැත අඩු වෙන්නේ
කලකිනි ලොවේ බුදු කෙනෙකුන් උපදින්නේ
බුදුවරු දැකුම එබැවින් දුර්ලභ වෙන්නේ
මේ ලෙස සිතා දෙවුරම වෙත පිය මැන්නේ

73. බුදු සමිඳුන් වෙතට ඒ හිමියන් යන්නේ
වැඳ බැති සිතින් ගරු බුහුමන් දක්වන්නේ
ආගිය තොරතුරුත් බුදු රජු විමසන්නේ
සියලුම පුවත් ඇති සැටියෙන් පවසන්නේ

74. මගෙ මව්පියෝ දැන් ඇත අසරණ වීලා
දුක සේ වසනවලු මෙහි සිඟමන් යැදලා
මව්පියො රකින්නෙමි සිවුරෙන් ඉවත් වෙලා
දෙනු මැන අවසරය මා හට සමාවෙලා

75. ඇයි භික්ෂුව ඔබ මේ ලෙස පවසන්නේ
මව්පියො රකින්නට ඇයි ගිහිගෙට යන්නේ
මව්පියනගෙ ගුණය ලොව ඉමහත් වන්නේ
මෙහි සිට මව්පියන් රැකුමට හැකි වන්නේ

76. මව්පියො ලොවේ මහ බඹු හා සම වෙන්නේ
මව්පියො දරුවන්ට මුල් ගුරුවරු වෙන්නේ
මව්පියො දරුවන්ට දෙවියන් සේ වෙන්නේ
ආහුණෙය්‍ය සඟ ගුණයෙන් යුතු වෙන්නේ

77. සත් සමුදුරේ පිහිනා පෙරුමන් පිරුවා
සත්වග සනසවන්නට බුදු බව ලැබුවා
මෙත් කරුණා ගුණය ලෝ සත වෙත බෙදුවා
සිත් සනසන වදන් කරුණාවෙන් දෙසුවා

78. මව්පියො නිසා ගිහිගෙට යන්නයි සිතුවේ
ගොස් මව්පියන් රැක ගන්නයි සිත යෙදුවේ
සම්බුදු පියතුමන් එගමන වැළකුවේ
මෙහි සිට එය කරන්නට හැකි බව දෙසුවේ

79. මව්පියො නිසා ගිහි ගෙදරට නොයන්නෙම්
මහණකමේ සිට මව්පියො රකින්නෙම්
ඔවුනට සලකන්න මම පිඬු සිඟන්නෙම්
මා හැදු ණය බරින් මෙලෙසින් මිදෙන්නෙම්

80. දහවල ගෙවී රෑ බෝ වී ඇති හන්ද
පාගමනින් ඇවිත් ගත වෙහෙසුණ හන්ද
ගෙන යාමට සුදුසු කිසිවක් නැති හන්ද
පිඬු සිඟ අහර ගෙනයන්නෙම් පහු වෙන්ද

81. දෙව්රම් විහාරේ හිමි රෑ ගත කරමින්
ගෙන් ගෙට වඩිනවා පසුදා පිඬු සිඟමින්
කැඳ පමණක් ලැබුණි හිමිදිරි උදසනින්
එය ගෙන වඩිනවා සිය මව්පියො සොයමින්

82. ඒ කැඳ ටික රැගෙන අම්බලමට වැඩලා
ඒ හිමි සිටිනවා මිදුලේ නැවතීලා
ඒ මව්පියො දෙපළ අලුයම අවදි වෙලා
විපරම් කරනවා සිටි හිමියන් දැකලා

83. හිමි දැක මව්පියන් සිතනව මේ විලසින්
බුදු පුතු කෙනෙක් වැඩ සිටිනවා පිඬු සිඟමින්
පිළිගන්වන්න කිසි අහරක් නොමැති බැවින්
පුතු නොම හැඳින මව කියනවා මේ විලසින්

| | |
|---|---|
| 84. වැහැරුණු මහලු යුවලකි හිමි අපි | දෙදෙනා |
| නොමැරෙන නිසා මේ අම්බලමේ | වෙසෙනා |
| අසරණ අපට කිසි අහරක් නැත | පුදනා |
| හිමියනි වඩිනු මැන වෙන තැනකට | ලැබෙනා |
| 85. එවදන් අස අසා හිමි එලෙසම | ඉන්නා |
| මව දැන් බලනවා විපරම් | කරමින්නා |
| පියාණන් කියනවා මව හට | මෙලෙසින්නා |
| ඇවිදින් සිටින්නේ පුතු දැයි | නොමදන්නා |
| 86. අපඅත හැර ගොසින් පුතු බොහො කල් | නේද |
| අප දැකන්න ඒ පුතු අවා | වත්ද |
| අප කිව් වචන නැති නම් ඇසුනේ | නැතිද |
| තොප ගොස් බලනු වැඩ ඉන්නා හිමි | කවුද |
| 87. එවදන් අසා මව හිමි ලඟටම | යන්නා |
| විමසිලිමත්ව බලමින් පුතු | හඳුනන්නා |
| දෙදෙනම ඇවිත් හිමි ළඟ වැඳ | වැටෙමින්නා |
| ඉවසුම් නැති සොවින් දෙදෙනා | වැළපෙන්නා |
| 88. මවුපියො අඬනවා හිමි පාමුල | වැටිලා |
| සිටිවන සිටිනවා හිමියන් ගල් | ගැහිලා |
| අසරණ මව්පියන් දැක කම්පා | වීලා |
| හිමි නෙත් දෙකින් යයි උණු කඳුළැලි | ගලලා |
| 89. මහ සිටු මැදුරෙ සැප විඳි සිටුවරු | නේද |
| සියුමැලි සිරුරු අයියෝ වැහැරිල | නේද |
| වටිනා සළු නැතිව වැරහැලි | අඳිනවද |
| අටලෝ දහම කාටත් උරුමයි | නේද |
| 90. සදහම වෙතම හිමි තම සිත යොමු | කරලා |
| නුවණින් සිතා ශෝකය යටපත් | කරලා |
| පාමුල වැටී අඬන මව්පියො | නැගිටුවලා |
| මේ ලෙස කියයි ඔවුනගෙ සිත් | සනසවලා |

91. අම්මේ තාත්තේ දැන් වැළපෙන්න එපා
පසුගිය දේ සිතා මතු දුක්වෙන්න එපා
නැති වූ දේ පතා කම්පා වෙන්න එපා
නොතිරයි තුන් ලොවේ පවතින සියලු සැපා

92. අම්මේ තාත්තේ මේ කැඳ ටික බොන්න
කුසගිනි නිවාගන සිත සනසා ගන්න
අද සිට එපා ඔබලා සිඟමන් යන්න
මට හැකිවේ ය ඔබ දෙදෙනා රැක ගන්න

93. මේ ලෙස කියා හිමි පිඬු සිඟමින් යනවා
ලැබෙන අහර ගෙන මවුපියනට දෙනවා
පාංසුකූල රෙදි සොහොනෙන් ගෙන එනවා
ඉතිරිවු දෙයින් තම ජීවිත ගෙන යනවා

94. ඒ හිමි මෙලෙස මව්පියනට සලකනවා
අනෙකුත් හිමිවරුන් මේ ගැන විමසනවා
සසුනට ලැබෙන දෙය ගිහියන් හට දෙනවා
කියමින් අනෙක් හිමිවරු දෙස් පවරනවා

95. බුදු හිමි ළඟට සඟ පිරිවර රැස් වෙනවා
මව්පියො රකින භික්ෂුව එහි කැඳවනවා
බුදුහිමි සඟ පිරිස මැද නඩු විසඳනවා
ඔබ සලකන ගිහියෝ කවුදැයි විමසනවා

96. අවසර, කාරුණික සම්බුදු පියණෙනි
මැ ඇති දැඩි කළේ මව්පියො දයාවෙනි
ඔවුනට සිටි එකම දරුවා මම ම වුනි
මම් සලකන්නේ මව්පියො අසරණ බැවිනි

97. සාදු සාදු භික්ෂුව ඔබ කරන මෙම
නුවණැති දෙයකි මවුපියනට සැලකීම
තිරිසන් අය පවා පෙර කළ උතුම් මෙම
නිවනට මගක් වේ මව්පියො සුරැකීම

98. අඳ මව රැකි ඇතෙක් පෙර කල මහ    වනයේ
එරටේ රජු විසින් මඟුලැත් හල    තැබුයේ
රස රජ බොජුන් ඇත් රජ හට පිරි    නැමුයේ
මව් නැති සොවින් ඇතු ඒවා නැත    කෑයේ

99. නුවණැති රජතුමා ඇතු ගැන    විමසන්නේ
අන්ධවු මව් රකින ඇතු බව    දැනගන්නේ
බැම්මෙන් මුදා ඇතු හට නිදහස    දෙන්නේ
ඒ ඇතු ගොසින් මව් ලඟමයි    නවතින්නේ

100. දින ගණනක් නිරාහාරව සිටිය    නිසා
පුතු නැති සොවින් වැළපෙන මව් ඇතිනි    නිසා
මවු ගුණ දන්න ඇතු තම කුස ගිනි    ඉවසා
මව හට කන්න දෙයි මවගේ සිත්    සනසා

101. දෙවනුව තම අහරගන්නා ඇත්    රජිඳු
අඳ මව් ඇතින්නට සලකනවා    සැමදු
මෙය දැක රට රකින ඒ නුවණැති    රජිඳු
ආදර්ශයෙන් ගුණ දම් සුරකී    සැමදු

102. මහා බ්‍රහ්ම ආචාරිය ගුණෙන්    යුතු
ආහුණෙය්‍ය අනුකම්පා ගුණෙන්    යුතු
මෙත් කරුණා දී බඹ විහරණ ගුණෙන්    යුතු
සැම දරුවන් විසින් මව්පියො රැකිය    යුතු

103. කළගුණ දැනීමකි මව්පිය    සැලකීම
ගත් ණය ගෙවීමකි මව්පිය    සැලකීම
පින් උල්පතකි මව් පියනට    සැලකීම
දෙව් සැප ලැබීමකි මව් පිය    සැලකීම

104. සසරට දුකකි මව්පියො ගැන    නොතැකීම
දුකකට මුලකි තණ්හාවෙන්    පැටලීම
නිවනට මඟකි මව්පියනට    සැලකීම
කාටත් සැපකි අම නිවනට    පැමිණීම

105. බුදු බණ අසා හිමි සිත සොම්නස පිරුණා
සිව් සත් දහම් හිමි හට අවබෝධ වුනා
සසර බැමි සිඳී මග ඵල පසක් වුණා
මව්පියො රැකි පිනෙන් නිවනට සැපත් වුනා

106. අසනා සැවොම බුදු ඔවදන් සුරකීවා
සිතනා සැමට මව්පිය ගුණ සිහිවේවා
හැදෙනා හොඳ දරුවො මව්පියො සුරකීවා
මව්පියො රැකි පිනෙන් නිවනෙන් සැනසේවා

107. මව් පිය ගුණ ගයා රැස් කළ පින් බෝවා
මෙසසුන රකින සම්දිටු දෙවියන් වුවා
සාදර සිතින් පින් අනුමෝදම් වේවා
මව්පියො රකින දරුවන් සැම සුරකීවා

108. භවයෙන් භවය මේ දිගු සසරේ ආවා
අපමණ මව්පියන් සසරෙදි හමු වුවා
ඒ සැම මව්පියන් දහමෙන් සැනසේවා
භව දුක් නසා අම නිවනට පත් වේවා

109. මෙසසර දුකට ඇත්තේ එක පිළිසරණ
මේ ලොව ඇති එකම සරණයි තුන්සරණ
සැනසුම ලබන්නට යා යුතු එම සරණ
ලොව සත් වගට වේවා තිසරණ සරණ

110. ලැබගත් මිනිස් බව මේ සක්වල දෙරණෝ
මා ලද එකම පිළිසරණයි තුන් සරණෝ
නිරතුරු ගයන්නෙමි සම්බුදු හිමි වරුණෝ
මෙතෙකින් නිමා වෙයි මව්පිය ගුණ වරුණෝ

නිමි.

**කතු හිමිගෙන්**

**මෙම මව්පිය ගුණ වරුණ කාව්‍ය සංග්‍රහය ඛුද්දක නිකායෙහි ජාතක පාලියට ලියන ලද ජාතක අට්ඨ කථාවෙහි මාතු පෝසක ජාතක කථාව ඇසුරෙන් සකසා ඇත.**

# අම්මේ සැනසෙන්න

| | | |
|---|---|---|
| 01. | සම්බුදු පියා ඉපදුන බුදු වුන | දින ද |
| | පහණක් ලෙසින් ඒ හිමි පිරිනිවි | දින ද |
| | වෙසගේ උතුම් පෝ දින නම් අද | නේද |
| | අම්මේ ඔබත් අද දින සැනසෙනවා | ද |
| 02. | සමතිස් පාරමී හද තුළ පිරී | ගියා |
| | වෙසතුරු අත්බවෙන් පසු තුසි පුරට | ගියා |
| | තුසිතෙන් චුතව පිළිසිඳ කුසයේ | මායා |
| | අද වැනි දිනක මව් කුසයෙන් බිහිවු | නියා |
| 03. | ලෝ සත වෙත මෙත් කරුණා | පැතිරෙව්වා |
| | පෙරුමන් පුරා භවයෙන් භවයට | ආවා |
| | බෝ මැඩ අරා වැඩ ඉඳ විදසුන් | වැඩුවා |
| | අද වැනි දිනක මරු පරද බුදු | වූවා |
| 04. | ගුණයෙන් උතුම් ගුණ කඳ ලොව | බිහිවූවා |
| | බඹලොව තෙක්ම ඒ ගුණ කඳ | පැතිරෙව්වා |
| | ගුණ නැණ බෙලෙන් අපමණ සිත් | සැනසෙව්වා |
| | අද වැනි දිනෙක ඒ ගුණ කඳ | පිරිනිව්වා |
| 05. | වෙසක් සඳේ සිසලෙන් ලොව | නැහැවෙනවා |
| | සිසිල් සඳෙන් වන මල් විකසිත | වෙනවා |
| | සදහම් සඳෙන් බොදු හදවත් | පුබුදනවා |
| | මමත් අම්මෙ දම් සිසිලෙන් | සැනසෙනවා |
| 06. | රාහුල පුතා දෑවැදි ලැබ ගන්න | කියා |
| | සුරතේ වෙලී සම්බුදු පියා අනුව | ගියා |
| | නොනැසෙන දයාද ඔබ හට දෙමිය | කියා |
| | සසුන්ගත කළා සැරියුත් හිමිට | ගියා |
| 07. | කප් ලක්ෂයක් තුළ පාරමි පිරී | ගියා |
| | සදහම් සිසිල් ගඟ ඒ සිත තෙමා | ගියා |
| | එකොළෙස් ගින්න ඒ හද තුළ නිවී | ගියා |
| | රාහුල පුතා භව කතරින් එතෙර | ගියා |

08. රාහුල මෙන් ම අම්මේ ඔබෙ පිනැති පුතා
සදහම් අමා දහරින් සැන්සෙන්න සිතා
රාහුල පුතා සැනසුන අම නිවන පතා
සසුන් ගුණ පුරයි අරණෝ දවස් පතා

09. මතකද අම්මේ අපි පන්සල් ගියපු හැටි
බැතිබර සිතින් අපි තෙරුවන් වඳපු හැටි
බෝධිය ළඟදි අපි බුදු ගුණ ගයපු හැටි
සොම්නස් සිතින් අපි දම් රස විඳපු හැටි

10. තෙරුවන් පුද පැතුවේ පුතු සැනසෙන්නයි
සතරවරම් දෙවියෝ පුතු රැක දෙන්නයි
සැප සම්පත් ලැබගෙන පුතු වැජඹෙන්නයි
එනමුත් පැතුවෙ සසුනට පුතු පිවිසෙන්නයි

11. තෙරුවන් වැඳගන්න අප පන්සලට ගියා
සම්බුදු දහම් ගඟ එතැනින් ගලන් ගියා
භවයේ අනිස එතුළින් වැටහිලා ගියා
සසරෙන් මිදෙන්නට හදවත නැමී ගියා

12. වඳිනෙම් ඔබෙ දෙපා අම්මේ පුතු මෙන්න
මගෙ අම්මවත් අම නිවනින් සනසන්න
මේ රුදු ඝෝර සසරින් එතෙරට යන්න
මහණ වෙන්න අම්මේ අවසර දෙන්න

13. උණු කඳුළැලිවලින් ඔබ නෙත් දෙක පුරවා
අඬලා තුරුල්ලට ගත්තා පොඩි දරුවා
කෙදිනක නමුත් ඔබ ගෙනයනවා මරුවා
පුතුනේ එහෙත් ඉඩ දෙන්නට නම් බැරුවා

14. සෙනෙහස අම්මෙ කාගේ සිතක ද නැත්තේ
එතුළින් කවුද රුදු මරුවා ජය ගත්තේ
ගිහි ගෙය ගිනි ගෙයකි මම් එය දැන ගත්තේ
මහණ වෙන්න අම්මේ ඉඩ දිය යුත්තේ

15. සසරේ මෙතෙක් එකොළොස් ගින්නෙන් දැවුනේ
ජරා මරණ දුක් ගින්නෙන් නැත මිදුනේ
සසුනේ සැනසුමයි අම්මේ මට දැනුනේ
මහණ වෙන්න නැති නම් මගෙ දිවි නැතිනේ

16. ඔබ වැනසුණොත් එය මාගෙ ද වැනසීමයි
පුත ඔබෙ සැනසීම අම්මග සැනසීමයි
දුක් ගිනි නැත්තේ පුතුනේ අම නිවනේමයි
එහෙනම් කළ යුත්තේ සසුනට පිවිසීමයි

17. ගිහි ගෙය ගිනි ගෙයකි මගෙ රත්තරන් පුතේ
දරු දුක ඇතත් මාගේ හද තුළත් පුතේ
සසුනට පිවිසෙන්න මාගේ පිනැති පුතේ
මහණ වෙලා මට ධර්මය දෙසන් පුතේ

18. දුන්නේ එද මෙලෙසින් අවසර අම්මේ
සසුන්ගත වෙන්න මගේ පෙම්බර අම්මේ
පුතුගෙන් වෙන් ව ඔබ සිටියත් දුර අම්මේ
නිවනට ලංව ඇත ඔබ පින් බර අම්මේ

19. දස මාසයක් ඔබ මා කුසයෙන් දැරුවා
කුසගිනි නිවන්නට රසවත් කිරි පෙව්වා
බිව් කිරි ණය ගෙවන්නට ඔබ මා සැර සෙව්වා
පින් ඇති පුතා බුදු සසුනට පුද කෙරුවා

20. සම්බුදු හිමිගෙ දහමෙන් සිත පුරවන්නම්
සම්බුදු දහම ලෝ සත වෙත පතුරන්නම්
කිරි බිව් කටින් සත හට දම් රස දෙන්නම්
පින්වත් අම්මටත් ධර්මය පවසන්නම්

21. කුරිරුයි ලොවේ අදමිටුකම් වැඩි වෙනවා
මිනිසුන් කෙරෙන් ගුණ දම් පිරිහී යනවා
ඉසි කෝ මද මාන සිත් තුළ දැඩි වෙනවා
ගුණ දම් රකින අය දහමෙන් සැනසෙනවා

22. දරුවන් නිසා දුක් කඳුලැලි හෙලුවේ ය
අපමණ පුතුන් සසරෙහි ඔබ ලැබුවේ ය
එපුතුන් ඔබව සනසන්නට නාවේ ය
අම්මේ තවම ඔබ බියකරු සසරේ ය

23. ඉපදුම දුකයි ලෙඩවීමත් දුක නේද
ජරා මරණ ඇත්තේ දුක මත නේද
බුදු සමිඳුන් අපට මෙය දෙසුවා නේද
එයින් මිදෙන මඟ අම්මට පෙනුනේද

24. බුදු ගුණ දම් ගුණ සඟ ගුණ වඩන්න
මෙත් කරුණා මුදු ගුණයෙන් වැඩෙන්න
මරණය උරුම බව නිති සිහි කරන්න
බවුන් වඩමු අම නිවනින් සැනසෙන්න

25. දිවි හිමියෙන් පන්සිලය සුරකින්න
පොහෝ දිනට පෙහෙවස් වී සුවසන්න
දිවා රැයේ ගුණ දම් සපුරා ගන්න
වෑයම් ගන්න මතු නිරයට නොයන්න

26. දුෂ්කර දෙයකි අම්මේ ඔබ කළේ උතුම්
ඔබගේ පිනෙන් දම් එළියෙන් සැනසෙන්නම්
පින් ඇති පුතා බුදු සසුනට පිදුව පිනෙන්
අම්මේ ඔබට අත් වේවා අමර නිවන්

27. භවයෙන් භවය ආවා රුදු සසර ගෙවා
මේ දුක් ගින්න නැගුනා තුන් භවෙම දවා
සදහම් ගඟ ගලයි එකොලොස් ගින්න නිවා
අම්මේ සැනසෙන්න බව දුක් ගින්න නිවා

නිමි.

**අම්මාවරු නොමැති කල මිනිස් ලොව හිස් වනු ඇත. සෙනෙහසේ උල්පතින් ගලන රස කිරි ද ඇති නොවේ. එහෙත් එම උල්පත කෙළෙස් සහිත ය. බුදු පුතුන්ටත් පිහිටවනුයේ අම්මාවරු ය.**

**අමා මෑණී බුදු පියාගෙන් ලැබෙන්නේ සදහම් අමා කිරි ය. එය ද නිකෙළෙස් ය. එය තුන් ලොවට අමා මිහිරකි. ඒ අමා මෑණී බුදු පියා ලොවට උපදවන්නේ ද අම්මා කෙනෙකි.**

**අම්මා** !!!

# පාරමී ගමන

01. බුදු බව පිණිස මා පාරමී පිරු සමයේ
මාගේ මව් බිසව් වූසති නම් වූයේ
වූසති දේවි ඒ දිවියට පෙර භවයේ
සක් දෙව් රජිඳුන්ට අග මෙහෙසුන් වූයේ

02. ඇයගේ ආයුෂය ටික ටික ගෙවී ගියේ
සක් දෙව් රජිඳු ඒ බව නුවණින් දුටුයේ
වර දහයක් දෙමි ඔබ හට පෙම්බරියේ
යනුවෙන් ඇයට සක් දෙව් රජිඳුන් කීයේ

03. එවදන් අසා ඇගෙ සිත කම්පා වූයේ
සක් දෙව් රජිඳුන්ට මේ ලෙස පැවසූයේ
ඔබ හට මෙමා ඇයි දැන් අප්‍රිය වූයේ
මොන වරදක්ද ඔබ හට මාගෙන් වූයේ

04. විසල් ගසක් මහ පොළොවේ වැඩී ගියේ
මහ සුළඟකින් ඒ මහ ගස බිම හෙලුයේ
එලෙසින් මෙමා මෙතුවක් කල් මෙහි විසුයේ
මෙතැනින් කිම ද ඔබ මා නෙරනට සිතුයේ

05. සක් දෙව් ඇයට නැවතත් මේ ලෙස කීයේ
ඔබගෙන් මෙමට නැත කිසි වරදක් වූයේ
කිසිදා ඔබව මට අප්‍රිය නොම වූයේ
දේවිය ඔබේ ආයුෂ දැන් ගෙවී ගියේ

06. චුත වෙන කාලේ දැන් ඔබෙ ළං වෙලා තියේ
එනිසයි ඔබට මම් වර දෙනවයි කීයේ
ඔබ හට සෙනෙහසින්මයි මා වර දෙනුයේ
එම වර දහය ගනු මැන දැන් පෙම්බරියේ

07. එවදන් අසා ඇය සතුටින් පිනා ගියේ
මා ඇතුළත් ව වර දහයක් ඉල්වූයේ
සුළු මොහොතකින් ඇය එතැනින් චුත වූයේ
මිනිස් ලොවේ රජ කුලයෙහි පිළිසිඳියේ

08. දස මස් ඇවෑමෙන් මොලොවට බිහිවූයේ
පින් සලකුණින් ඵුසති නාමය ලැබුයේ
සුවසේ වැඩි වැඩී වයසට පත් වූයේ
සංජය රජුට ඇය අග මෙහෙසුන් වූයේ

09. එකලට මමත් දෙව් ලෝකෙන් චුත වූයේ
ඵුසතී දේවිගේ කුසයේ පිළිසිඳියේ
මගෙ පින් තේජසත් මව හට බලපෑයේ
එතැන් පටන් දන් දෙන්නට මයි සිතුයේ

10. දුප්පත් මහලු ගිලනුන් ඇය වෙත ආයේ
සිඟමන් යදින්නන් මගියන් නිති ආයේ
තවුසන් පැවිද්දන් බමුණන් වෙත ආයේ
ඒ සැම දෙනට ඉල්වන සැම දෙය දෙවුයේ

11. දස මාසයක් ඇය මා කුසයේ දැරුයේ
යස පිරිවරින් නගරය පැදකුණු කෙරුයේ
නගරයෙ වෙළඳ වීදිය වෙතටයි ආයේ
එහිදී මෙමා ඇගෙ කුසයෙන් බිහි වූයේ

12. පිය පසයෙන් මගේ නාමය නොම වූයේ
මව් පසයෙන් ද මාගේ නම නොම වූයේ
වෙළඳ වීදියේ මැද මා බිහි වූයේ
එබැවින් මගේ නම වෙස්සන්තර වූයේ

13. නෑ නොකියමින් දන් දෙන පුතෙකුයි පැතුයේ
ඵුසති දේවිගේ අදහස ඉටු වූයේ
උපතින් මෙමා අටවෙනි වසරයි ගෙවුයේ
හිඳ ප්‍රාසාදයේ දන් දෙන්නට සිතුයේ

14. ආවොත් ඉල්ලමින් කිසිවෙක් යම් දිනයේ
හදවත ඇස් ද මස් ලේ දෙමි නොපැකිළියේ
මේ සිරුරම වුවත් ඕ හට මම දෙමියේ
නොසැලෙන සිතින් මා මේ විලසින් සිතුයේ

15. සිතනා විටදි මේ විලසින් ඇති සැටියේ
නොසැලෙන මහ පොළොව සෙලවුණි හිටි හැටියේ
අඩ මසකින් එළැඹෙන පුන් පෝ දිනයේ
බුදු බව ලබන්නට දන් පාරමී පිරුයේ

16. දස රජදමින් රජ කර වූ එම සමයේ
දන්සැල් සාදවා ජේතුත්තර පුරයේ
එන ඒ සැමට දන් දෙවනවා සැම දිනයේ
බුදු බව ලබන්නට දන් පාරමී පිරුයේ

17. බමුණන් කළිඟු දේසේ ඉඳලයි ආයේ
වැසි නැති එරට දුර්භික්ෂාවක් වූයේ
රජ වාහනේ මංගල සම්මත වූයේ
එම සුදු ඇත් රජා බමුණන් ඉල්වූයේ

18. දීමෙහි මගේ සිත නිතරම ඇලී තියේ
කම්පා නොවී ඇත් රජු දෙමි යැයි කීයේ
රන් කෙණ්ඩියක් ගෙන සුරතට පැන් වැඩුයේ
සොඬගෙන ඇත් රජුගෙ බමුණන් අත තැබුයේ

19. අකම්පිතව ඇත් රජු දන් දුන් සැටියේ
මේ මහ පොළොව නැවතත් කම්පා වූයේ
මේ දනයේ වටිනාකම නොම දනුයේ
සිවි රට වැසියන්ගේ සිත් කම්පා වූයේ

20. මහ මැති ඇමති රට වැසියන් රැස් වූයේ
මොහොතින් රජ මිදුල සැම තැන පිරී ගියේ
මෙපුවත මහ රජුට ඒ සැම දැන් වූයේ
රජු හට විරුද්ධව සැම දෙන දෙස් නැගුයේ

21. දිය යුතු කොතෙක් වස්තුව මේ රටෙහි තියේ
රටක් වටින ඇත් රජු ඇයි දන් දෙනුයේ
රට වනසන්ට අප නම් නැත ඉඩ දෙනුයේ
වෙස්සන්තර කුමරු මෙරටින් නෙරපනුයේ

22. රට වැසි විරෝධය මහ ඉහළින් වූයේ
සංජය රජුට කළ හැකි කිසිවක් නොවූයේ
වෙස්සන්තර කුමරු වෙත මෙය දැන්වූයේ
මා කළ වරද කිමදැයි ඔහු විමසූයේ

23. ඇත් රජු දුන් නිසයි මේ දෙය සිදු වූයේ
රට වැසියන් පැමිණ උද්ඝෝෂණ කෙරුයේ
යා යුතු වේ ලු ඔබ තපසට හිමාලයේ
මහ රජතුමා දැන් මෙය අනුමත කෙරුයේ

24. මා දෙන දන වැසියන් හට එපා නම්
තපසට හිමාලෙට මම් පිටවී යන්නම්
දන් දීමට නොහැකි නම් මේ රටේ ඉඳන්
මා හට වැඩක් නැත මේ රජ සැප විඳුමෙන්

25. තව එක දිනක් මා හට සැම ඉඩ දේවා
සත් සියයක් බැගින් හෙට මම් දන් දෙනවා
වංකගිරියේ තපසට ඉන් පසු යනවා
කියමින් පසු දිනේ මහ දනය දෙනවා

26. වැඳ මව්පියන්ගෙන් අවසර ඉල්වනුයේ
මද්දි දේවි දරු දෙදෙනත් සැරසෙනුයේ
රජගෙන් පිටව සිවු දෙන රථයට නැගියේ
රජගෙයි සැවොම දුක් ශෝකෙන් වැළපෙනුයේ

27. ඵුසති මව් බිසව වස්තුව ගෙන්වාලා
රථයට පිරෙව්වා දන් දෙන්නට කියලා
දහ අට වරක් යාචකයන් හට දීලා
ඒ සැම නිම කළා මගදී දන් දීලා

28. බමුණන් අශ්වයන් සිව් දෙන ඉල්වන්නේ
රථයෙන් මුද අශ්වයො ටික දන් දෙන්නේ
දෙවියන් පැමිණ මුව වේශය ගනිමින්නේ
රථයට කර තබා දැන් අරගෙන යන්නේ

29. තව බමුණෙක් පැමිණ රථයත් ඉල්වන්නේ
නොමසුරු සිතින් එම රථයත් දන් දුන්නේ
දෙවියන් රථය අත හැර නොපෙනී යන්නේ
වෙසතුරු නරිඳු පා ගමනට බැස ගන්නේ

30. මහසත්තුමා ජාලිය පුතු වඩමින්නේ
දේවිය ක්‍රිෂ්ණාජිනා දුව සුරතට ගන්නේ
මහ මඟ ගෙවා දැන් වනයට පිවිසෙන්නේ
මේ සිවු දෙනා වනයේ සිරි නරඹන්නේ

31. පලතුරු ඉල්වමින් දරුවන් වැළපෙන්නේ
ගස් අතු නැමී දරුවන් ළඟටම එන්නේ
වෙසතුරු රජුගෙ පින් මහිමය දකිමින්නේ
මද්දි දේවි සන්තෝසෙන් ඉපිලෙන්නේ

32. දුරු මඟ ගෙවා චේතිය රටටත් ආවා
මාතුල නගරෙ නෑයන් සැම රැස් වූවා
විශ්මෙට පත්ව තොරතුරු සැම විමසූවා
වෙසතුරු නරිඳු සියලුම තතු පැවසූවා

33. තොරතුරු අසා ඒ සැම දෙන දුක් වූවා
රස මුසු භෝජනෙන් හොඳ හැටි සැලකූවා
තපසට වංකගිරියට නොයනට කීවා
චේතිය රජය බෝසතුනට පැවරූවා

34. වෙසතුරු එබෝසත් එය පිළිකෙව් කෙරුවා
පිය රජු අණ කඩන්නට බැරි යැයි කීවා
පසළොස් යොදුන් මග ඉදිරියටම ගෙව්වා
චේතිය රටේ අය මුර කරුවෙකු යෙදුවා

35. කඳු වැටි වන වදුල් ගංගා පසු　　කරලා
බිහිසුණු වන සතුන් ඇති වනයට　　වැදිලා
වන සිරි නරඹමින් තැන තැන　　නැවතීලා
පා ගමනින් ම යනවා දුරු මඟ　　ගෙවලා

36. මහ වන මැද තිබුණ අසපුවකුත්　　දැකලා
එතැනට පිවිසුනා මඟ ඇසුමට　　සිතලා
අච්චුත තවුස් තුම තොරතුරු　　විමසාලා
මඟ පෙන්නුවා යන්නට වංකගිරි　　බලා

37. තපසට ඇදෙන වෙස්සන්තර　　නරිඳුන්ට
සුවසේ වසන්නට පාරමී　　සපුරන්ට
වංකගිරිය තුළ අසපුව　　කරවන්ට
සක් රජු අණ කළා විශ්කම්　　දෙවියන්ට

38. ඔහු විගසින් ගොසින් මහ වනයට　　වැදිලා
මනරම් විලාසෙන් අසපුව　　සකසාලා
කුටි දෙකකුත් මවා සක්මන් මලු　　මවලා
දෙව්ලොව ගියා තාපස පිරිකර　　තබලා

39. වෙසතුරුතුමා ලං වී අසපුව　　ළඟට
දෙදෙනම පිවිසුනා මනරම් කුටි　　දෙකට
ගලවා රජ ඇඳුම් ගෙන පිරිකර　　අතට
විගසින් සැරසුණා සැම තවුසන්　　ලෙසට

40. බෝසත් කියනවා දේවිට මෙ　　වෙලාවේ
ස්ත්‍රිය බ්‍රහ්ම චරියාවට කිලුටක්　　වේ
මින් පසු එන්නෙපා ඔබ මෙහි　　අවෙලාවේ
බඹසර සිතින් ශීලය රැකගත යුතු　　වේ

41. මද්දි දේවි එය සතුටින්　　පිළිගන්නා
වනයේ ඇවිද ගොස් පලවැල　　නෙලමින්නා
වෙසතුරුතුමා දරුවන් රැක　　ගනිමින්නා
සත් මාසයක් අසපුවෙ සතුටින්　　ඉන්නා

42. තව එක් දෙයක් මේ අතරෙදි සිදුවෙන්නා
අඹු සැමි ලෙසින් දුන්නිමිත්ත ගම ඉන්නා
සීයයි මිණිබිරියි සේ වයසත් වෙන්නා
යුග ජීවිතේ නිසි සේ නොම ගැළපෙන්නා

43. තරුණ බිරිය තරුණෙකු හා එක් වෙන්නා
මහලු සැමියා ගෙයි රැකවල් තර කරනා
වැඩ කර ගන්න වහලුන් ගෙනෙනා ලෙසිනා
තරුණිය මහලු බමුණා ගෙන් පිට කරනා

44. වහලුන් සොයා ජූජක බමුණ යනවා
වෙසතුරුතුමාගෙන් දරුවන් ඉල්වනවා
පාරමි සපුරන්න කටයුතු සැලසෙනවා
මහසත්තුමා දැන් සතුටින් පසුවෙනවා

45. මද්දි දේවි පල වැළ නෙලමින් යන්නා
වෙන ද නොමැති දේ වනයෙහි සිදු වෙන්නා
පලවැළ නෙළන කෙක්කත් බිම වැටෙමින්නා
ගල් මුල්වල සැපී ඇගෙ පය පැකිලෙන්නා

46. දරුවන් ඉල්වමින් බමුණා මොර දෙන්නා
මව එන තුරා ඉන්නැයි දරුවන් කියනා
බෝසත්තුමා මතු බුදුබව පතමින්නා
ජාලිය ක්‍රිෂ්ණාජිනා දරුවන් දන් දුන්නා

47. බමුණා දරුවන්ගේ අත් දෙක බඳිමින්නා
පහර දි දී දරුවන් අරගෙන යන්නා
වෙසතුරුතුමාගේ සිත කම්පා වෙන්නා
දහමට සිත යොමා ඒ සැම ඉවසන්නා

48. මද්දි දේවි වනයෙන් ආපසු එනවා
වග කොටි වළස් ඇය එන මඟ අවුරනවා
පාරත් වැරදිලා තැන තැන ඇවිදිනවා
සැන්දෑ යාමයේ අසපුව වෙත එනවා

49. වෙන ද ඉදිරියට දුව එන දරු දෙදෙනා
අද දින ඇගේ නෙත් හමුවට නොම එන්නා
අසපුවෙ සියලු තැන දරුවන් සොයමින්නා
වෙසතුරු නරිඳුගෙන් ඒ ගැන විමසන්නා

50. ගල් පිළිමයක් විලසින් බෝසතු ඉන්නා
රෑ එළි වෙන තුරා දරුවන් සොයමින්නා
ශෝකෙන් අඬ අඬා නිරතුරු වැලපෙමිනා
අරුණෝදයේ බෝසත් අබියස වැටුනා

51. සත් මාසයක් අත නොතබා රැකි සීලේ
බෝසත් මද්දි දේවිය තබමින් උකුලේ
සිහි ගන්වමින් ඇය සනසාලා එවෙලේ
සිදු වූ පුවත ඇති සැටියෙන් පැවසු වෙලේ

52. ඇයි හිමියනේ මා වෙහෙසට පත් කෙරුවේ
මුලදිම මෙමට ඇයි මේ ගැන නොම කීවේ
දේවිය ඔබේ ශෝකය බලවත් වූවේ
එනිසයි පළමුවෙන් ඔබ හට නොම කීවේ

53. පස් මරු පරදවා බුදු බව ලැබ ගන්න
බෝසතුනට සිදුවේ දරුවන් දෙන්න
බුදු බව පතා මම් දරුවන් දන් දුන්න
දේවිය ඔබත් පින අනුමෝදම් වෙන්න

54. දේවිය හදේ ඇති ශෝකය අඩු කෙරුවා
තම හිමියන්ගේ වචනෙට සිත නතු කෙරුවා
සාදු සාදු යැයි එය අනුමත කෙරුවා
සොම්නස් සිතින් පින් අනුමෝදම් කෙරුවා

55. දන්දෙන වෙලාවේ සිය දරුවන් දෙදෙනා
සිත් පිත් නොමැති පොළවත් කම්පා වෙන්නා
වන දෙව් කැලත් සැම සොම්නස පතුරන්නා
සක්දෙව් රජිඳුන්ට මේ සැම දෙය පෙනුනා

56. ළාමක කෙනෙක් ඇවිදින් දන් ඉල්වන්නේ
මහ බෝසත්තුමා දේවිය දන් දෙන්නේ
කිසිවෙක් එතුමන්ට පිහිටට නැති වෙන්නේ
සිතමින් එසක් දෙව් විගසින් පැමිණෙන්නේ

57. බමුණු වෙසින් විත් දේවිය ඉල්වන්නේ
බෝසත්තුමගේ සිත සතුටින් ඉපිලෙන්නේ
මද්දි දේවිගේ සුකොමල අත ගන්නේ
සැනෙකින් සක් බමුණු හට ඇය පවරන්නේ

58. නැවතත් වරක් පෘතුවිය කම්පා වන්නේ
වන දෙවියන් සැවොම සොම්නස පතුරන්නේ
පින්වත් බමුණු දේවිය ආපසු දෙන්නේ
සක් දෙව් ලෙසින් සිට අහසේ බැබළෙන්නේ

59. බුදු බව පිණිස ඔබෙ පාරමි දැන් පිරුනේ
දේවිය කිසිවෙකුට මින් පසු නොම දෙන්නේ
තුටු පඬුරක් ලෙසින් මම දැන් වර දෙන්නේ
ඒ දෙන වරය ඔබ රිසි සේ ඇර ගන්නේ

60. මාගේ රජ සැපත නැවතත් ලැබදේවා
සිරවී සිටින්නන් සැමදෙන මුදවම්වා
දන් දෙනු පිණිස මට වස්තුව ලැබදේවා
සැමහට පිහිට වෙන්නට මට හැකිවේවා

61. අනුනගේ භාරියන් හා එක් නොම වේවා
ස්ත්‍රී වසඟයට මම් පත් නොමවෙම්වා
දරුවන් මගේ දිගු ආයුෂ ඇති වේවා
දෙව් ලොව ගොස් පැමිණ බුදු බව ලබනෙම්වා

62. ඔබ පැතු සියලු දෙය එලෙසම සිදුවන්නේ
කියමින් එසක් දෙව් රජු දෙව් පුර යන්නේ
ඉන්පසු දෙදෙන සන්තෝසෙන් පසු වෙන්නේ
ජූජක තවම දරුවන් අරගෙන යන්නේ

63. දෙවියන් මද්දි දේවියගේ වෙස් ගන්නේ
මව විලසින් ගොසින් දරුවන් රැක ගන්නේ
දේව බලෙන් ජූජක මඟ වරදින්නේ
සංජය රජු වෙතට දරුවන් හා යන්නේ

64. මහ රජු ජූජකව විගසින් කැඳවන්නේ
තොරතුරු අසා දරු දෙදෙනා මුදවන්නේ
ජාලිය කුමරු සීයට දෙස් පවරන්නේ
ඒ මහ රජුගෙ හදවත උණු වී යන්නේ

65. සිව් රඟ සේනාව විගසින් රැස් කරලා
මහ පිරිවරින් යන්නේ වංකගිරි බලා
මහ වන මැදදි රජ පිරිවර එක්වීලා
සුව දුක් විමසුවා සැමදෙන වැලපීලා

66. මේ දැක බලා සිටිනට නොමැතිව වාගේ
නැවතත් පොළොව කම්පා වුණි මහ වේගේ
මහ රජු සමාවක් ගෙන බෝ සතුන්ගේ
රජකම බාර දුන්නා පැතුවා වාගේ

67. මහ පිරිවරින් නැවතත් නුවරට යන්නේ
වෙසතුරු නරිඳු මේ විලසින් සිතන්නේ
මා ආ බව අසා යාචකයන් එන්නේ
ඉල්ලන විටදි ඔවුනට මොනවද දෙන්නේ

68. සක් දෙවිඳුන්ට එම අදහස දැනෙන්නේ
සත් රුවනුත් සමඟ මහ වැසි වසින්නේ
මහ බෝ සතානන්ගේ පින් බලයෙන්නේ
සත් වෙනි වරට පෘතුවිය කම්පා වෙන්නේ

69. වෙසතුරු නරිඳු එම වස්තුව අරගන්නේ
දිවි ඇති තෙක්ම සිත් සතුටින් දන් දෙන්නේ
දස රජදමින් පිහිටා රජ කරමින්නේ
පිරිවර සමඟින් ම තුසි පුරයට යන්නේ

70. ජූජක එද දෙව්දත් තෙරණුවෝ ය
ජූජක බිරිය චිංචා නම් තරුණිය ය
චේත රටේ මුරකරු චන්න ඇමති ය
අච්චුත තවුස්තුම සැරියුත් තෙරණුවෝ ය

71. සක් දෙව් රජිඳු අනුරුදු මහ තොරණුවො ය
මද්දි දේවි රාහුල මාතාවෝ ය
ජාලිය කුමරු රාහුල මහ තොරණුවො ය
ක්‍රිෂ්ණාජිනා උප්පල වණ්ණාවෝ ය

72. සංජය නරිඳු සුද්ධෝන රජතුම ය
ඵුසති දේවි මහමායා බිසවම ය
සෙසු ඒ පිරිස අද මේ බුදු පිරිසම ය
වෙස්සන්තර නරිඳු අද බුදු වූ මම ය

73. මෙලෙසින් එද දම් ඇසුනේ වැඩ ඉඳිමින්
සම්බුදු පියාණෝ සුමධුර දම් දෙසමින්
නෑ පිරිවරට සග මොක් සුව සද දෙමින්
ඔවුනට දෙසනවා නැවතත් මේ විලසින්

74. ජාලිය ක්‍රිෂ්ණාජින ගුණවත් දරු දෙදෙනා
පණ හා සම වු මද්දී දේවිත් තිදෙනා
අකම්පිතව බමුණන් හට දන් දෙමිනා
වෙනසක් නොසිතුවෙමි බුදු බව පතමින්නා

75. දරුවන් දුන්නෙ මට අප්‍රිය නිසා නොවේ
දේවිය දන් දුන්නේ අප්‍රිය නිසා නොවේ
ප්‍රිය දේ දන් දුන්නේ අප්‍රිය නිසා නොවේ
සැමටම වඩා බුදු බව ප්‍රිය නිසා ම වේ

76. මෙලෙසින් එද අපෙ සම්බුදු පියා අනේ
වෙසතුරු චරිතෙ විසිතුරු ලෙස දෙසුවානේ
භව දෙක ගලපමින් සිවුසත් දෙසූ සැනේ
අපමණ දෙනා ලොවුතුරු සුව ලැබුවානේ

77. දිගු කල් භවෙන් භවේ පාරමී දම් පුරලා
කෙළෙසුන් නසා සම්බුදු පදවිය ලබලා
පන්සාලිස් වසක් සතහට දම් දෙසලා
අජරාමර නිවන් පුරයට වැඩම කළා

78. මහ ගිනි කඳක් දැල් වී නිවුනා විලසේ
තුන් ලොව එළිය කළ පහනක් නිවුනා සේ
සක්වල එළිය කළ හිරු නොපෙනුනා සේ
පිරිනිවී ගියා නැවතත් නොපෙනන විලසේ

79. ඇති වූ දෙයක් ඇත්නම් වේ නැතිවීම
අනිසයි තුන් ලොවේ පවතින දේ සෑම
තිස් එක් තලයේ ම ඇත්තේ වැනසීම
නිවනේ තමා ඇත්තේ එක සැනසීම

80. මව කර පිට තබා මුහුදෙන් ගොඩවෙමින
භව සයුරට නොබැස පෙරුමන් සපුරමින
ලොව දනහට ලබා දෙවමින් සුවසහන
නිවනට වැඩියෙ නිමවා පාරමී ගමන

නිමි.

**සසර බියකරු ය. නිවන සුවබර ය. ඉපදුනොත් ලොවේ ලෙඩවීඹ, දිරීම, මරණය ඇත. මැරුණොත් යළි ඉපදීම වේ. එයයි සසර. එයයි දුක. මෙය නොනවතින ගමනකි. දුක් ගමනකි. පින් පව් කිරීම සසර ගමන දුක් ගමනට හේතු වේ. නිවන් පතා කුසල් කිරීම සසර ගමන නවතන පිළිවෙතයි. ඕර නම් මෙතෙරය, පාර නම් එතෙරයි, නිවන යි. නිවන් පතා කරන කුසල් පාරමී නම් වේ. ඒ පාරමී ගමන අපිත් යමු.**

# ගමනක අවසානය
## (රාහුල මාතා චරිතය අනුසාරයෙනි)

01. දෙවඟන විලස රුව ඇති බිම්බා දේවී
යස පිරිවරින් දෙවනුව යසෝදරාව වී
විසි නව වියෙන් පසු රාහුල මාතා වී
දහමෙන් සැනසුනා ඇය බුදු සසුනට වී

02. තම අසපුවේ ඉඳ ඇය මේ ලෙස සිතුවේ
අගසව් නන්දා දි තෙරවරු පිරිනිව්වේ
ගෝතමී ප්‍රජාපතී තෙරනිඳු පිරිනිව්වේ
මගෙ පිරිනිවුම කොයි දිනයකදෙ සිදුවේ

03. සිදුහත් කුමරු හා එක දින උපන් මම
වයසින් ගුණයෙන් ද එක හා සම වූ මම
බුදු හිමි ලැබූ නිවන සම ලෙස ලැබූ මම
එනමුත් සුදුසු නැත එකටම පිරිනිවුම

04. බැලුවා බුදු රජුන්ගේ ඇය පෙර කාලේ
බිසව් වෙලා සිටි තෙරණින් ගිහි කාලේ
රහත් වෙලා පිරිනිවියේ කොයි කාලේ
බුදු සමිඳුන්ට පෙර සිදුවුණි සැම කාලේ

05. උපතින් හැත්තෑ අටවෙනි වසරයි ගෙව්වේ
බුදු හිමි එදා ගිජුකුලු පවුවෙයි විසුවේ
රාහුල මාතා තෙරණිඳු එහි වැඩමෙව්වේ
බුදු සිරිපතුල් වැඳ මේ විලසයි කිව්වේ

06. වයසත් මගේ දැන් හොඳටම මෝරාලා
ජීවත්වීම දැන් මගෙ අවසන් වීලා
පිහිටක් මෙමට දැන් මා ඇත සිදු කරලා
මහසත් මහිමි දැන් යමි ඔබ අත හැරලා

07. උපතින් ගෙනා ජීවිතෙ අවසන් — කාලේ
මරණයමයි දිවි ගමනට බාධා — කලේ
මහා වීරයාණෙනි අද රෑ — කාලේ
මම පිරිනිවන්නෙමි සිඳ ජීවිත — ආලේ

08. ඉපදුම ලෙඩ වීම ගත ජරපත් — වීම
මරණය සිදී නොම වෙද පුද්ගල — දැකුම
ලැබගන්නට අම නිවනේ — සැනසීම
අවසර පතන්නෙමි මහ මුනිඳුනේ — මම

09. සසරෙන් මුදන්නට ලොව සත්වග — බොහොම
පස් මරු පරදවා ලොව බුදු වුනේ — මම
යදිනා විටදි කවුරුන් හෝ — පිරිනිවුම
අවසර නොදීමක් සිදු වෙන්නේ — කොහොම

10. බුදු හිමි දෙසනවා තෙරණිට මේ — විලසින්
ඔබෙ ගුණ නොම දනී මේ ලොව බොහෝ — දනන්
ඒ ගුණ කඳ දක්වමින් පෙළහර — පාමින්
ඉන් පසු සුදුසු වේ පෑමට — එපිරිනිවන්

11. ලැබ අවසරය අපෙ සම්බුදු සමිඳු — වෙතින්
ඔද බැති සිතින් සම්බුදු සිරිපා — වඳිමින්
මුල සිට අගට සමවතකට — සමවදිමින්
පෙළහර ඇරඹුවා නැග අහසට — තෙරණින්

12. සම්බුදු පියාණෙනි මහ කරුණා — ධීර
සාකිය කුලේ ඉපදුනෙ මම පිනෙන් — බර
ගිහි කල බිරිඳ වූයේ ඔබෙ පෙමින් — බර
දෙවියනි බ්‍රහ්මයිනි මම වෙමි — යසෝදර

13. අභිඤ්ඤදා සිතින් පිට කළ මේ — නාදේ
දස දහසක් සක්වල පැතුරුනි — නාදේ
කෝටි ගණන් දෙව් බඹු රැස් වී — නිබඳේ
පෙළහර නැරඹුවා සිටිමින් ගුවන් — ගැබේ

14. දඹදිව් තලේ මිනිසුන් ඉඳ තම නිවසේ
සැම දෙන නැරඹුවා පුන් සඳ මෙන් අහසේ
තෙරණිය සමවැදී ගිනි කසිණෙට සුවසේ
ගිනි කඳ පිට කළා සිය සිරුරෙන් රිසිසේ

15. නැවතත් පෙනී සිටිමින් නොපෙනී සිටිමින්
ලක්ෂ ගණන් භික්ෂුණී රූ වෙස් ගනිමින්
ඒ සැම දෙනම එකවර මහ හඬ නගමින්
විශ්මෙට පත් කළා සැම දෙන මේ විලසින්

16. බුදු බව ලබන්නට මහ ගුණ කඳින් දරා
පාරමී දම් පුරන්නට මේ සසර පුරා
බිරියන් වෙලා අත දුන්නේ සිතින් දරා
ඒ හැම පැවසුවා මම වෙමි යසෝදරා

17. දෙව් බඹ සාදු නද සැම තැන පැතිරීලා
සැණෙකින් භික්ෂුණී වේශය අත හැරලා
මහ දඹ ගසින් බුදු සමිඳුට පවන් සලා
පෙළහර දැක්කුවා මහ ගුරුළෙක් වීලා

18. මවමින් ඇත් වෙසක් අත හැර ගුරුළු වෙස
පරසතු රුකෙන් මල් හැලුවා මුනිඳු දෙස
අහස පුරා අස් රූ මවමින් විගස
පෑ පෙළහර බලා නැගුවා සාදු ගොස

19. මහ සුළඟක් මවා පොළොවේ ගල් දෙදරා
පුළුන් වගේ පාවෙනවා අහස පුරා
සැණෙකින් ඒ සියලු දෙය අතුරුදන් කරා
මහ මුහුදක් මැවුණි ඉන් පසු අහස පුරා

20. මාළු වෙසක් මවමින් රළ ගොස නගමින්
තෙරණිය පිහිනුවා ගුවනේ මැව් මුහුදින්
සඳ තරු පෙන්නුවා දහවල් දිලෙන ලෙසින්
මහමෙර පෙන්නුවා එය පෙරළා දමමින්

| | | |
|---|---|---|
| 21. | බුදු රජු සක් භවන පෙන්වූයේ | දහමින් |
| | ඔබහට පෙන්වාදෙමි මම එය සෘද්ධි | බලෙන් |
| | කියමින් එසක් දෙව් පුර සැනෙකින් | මවමින් |
| | සක් දෙව් විලස පෙනුනා තෙද ඇති | තෙරණින් |
| 22. | දස දහසක් සක්වල සක් පුරෙන් | ඉඳුන් |
| | ඇවිදින් තෙරණි හට වැන්දා සක් | දෙවිඳුන් |
| | මම වෙමි යසෝදරා ගිහි කල වූ | බිරිඳුන් |
| | විශ්මෙට පත් කළා සැම මේ ලෙස | කියමින් |
| 23. | මහ දෙව් රජෙක් වීලා සුළු | මොහෙතින්ම |
| | සක්වල වටේ ඇරඹූවා සැරි | සැරුම |
| | බුදු බල නොදත් පිට සක්වල දෙනට | සැම |
| | බුදු බල පෙන්නුවා ඉදු බල | පාමින්ම |
| 24. | කරලා අතුරුදන් ඒ හැම සුළු | මොහොතින් |
| | පෙළහර කළා පෙර දිව් දකිනා | නුවණින් |
| | මහ බඹු ලෙසින් අහසේ පලඟින් | ඉඳිමින් |
| | මේ ලෙස පැවසුවා විසිතුරු දම් | දෙසමින් |
| 25. | බෝ සතුනට බොහෝ කල් පක්ෂව | ආවේ |
| | සුදසුන් රජුගෙ බද්ද මෙහෙසුන් | වූවේ |
| | දසය දහක් බිසවුන් හට දෙටු | වූවේ |
| | මේ මම් තමා ඒ අග මෙහෙසුන් | වූවේ |
| 26. | බෝසත්තුමා ජාතකයෙහි මණි | චෝර |
| | මරණෙට ලං කළා අදමිටු රජු | කෲර |
| | පතිවෘතා ගුණය මම පෙන්වා | වීර |
| | දිව් රැක දුනිම් ගලවා මරණින් | කෲර |
| 27. | කුම්මාස පිඬු ජාතකයෙහි එක් | කලෙක |
| | මහසත්තුමා දැහැමින් රජ කළ | සමෙක |
| | පාරමී පුරන්නට පිහිටවු බිසව් | එක |
| | මා බව පින්වතුනි දැනගනු නොවී | සැක |

28. චුල්ල බෝධි ජාතකයෙහි අප දෙදෙනා
සියලු සැපත් හැරද වනයට ඇදුනා
එක අසපුවෙ ඉඳන් බඹසර වසමින්නා
ශීලය පුරන්නට මහිමිට උදව් වුණා

29. උදය බද්ද ජාතකයේ අප දෙදෙනා
සත් සිය වසක් එක යහනේ සැතපෙමිනා
කාමෙන් නොබලමින් බඹසර වසමින්නා
සක් දෙවිඳුගෙන් පැසසුම් ලැබුවා එදිනා

30. රාම රජුව බෝසත් දස රථ කාලේ
දස රජ දමින් රජ කරවූ එම කාලේ
සීතා නමින් බිසවුන් වී සිටි කාලේ
පතිවෘතාව රැක්කෙමි මම ඒ කාලේ

31. අසයිහ නම් ජාතකයේ මහිමි සඳ
මහ සිටු වෙලා තම සම්පත් බෙදන සඳ
අලසකමින් නෑ බෑ නොකියමින් ඉඳ
පිරුවේ දන පාරමි දෙදෙනා එසඳ

32. ජාතකයේදි තව වරකදි සඳ කිඳුරු
ශීලයෙ බලෙන් ගෙන්වා දෙව් රජු සොඳුරු
ගලමින් තිබුණු මහිමිගෙ සිරුරින් රුහිරු
දිවි රැක දුන්නු පෙම්බරි යයි මම කිඳුරු

33. බෝසත් මහිමි ජයදිස නම් ජාතකයේ
මිනි මස් බුදින යක්‍ෂයෙකුට අසුවූයේ
ශීල බලෙන් මුදවා රජ සැප දෙවූයේ
මම මයි එද ඒ රජ මෙහෙසිය වූයේ

34. චම්පෙය්‍ය නම් නා රජු බෝසත් සමයේ
සිය දිවි පුද බැතියෙන් සිල් ගුණ පිරුයේ
අහිගුණ්ඨිකයෙකුට බෝසත් හසු වූයේ
එදුකින් එද මා එතුමන් ගැලවූයේ

35. සුළු සුතසෝම නරනිඳු එම ජාතකයේ
පැසුණු නර කෙසක් දැක තපසට වැඩියේ
රජ සැප හැර දමා එතුමන් අනුව ගියේ
චද්‍ර දේවි මෙහෙසිය මම මයි වූයේ

36. මහා ජනක රජු හා රජ සැප හැරද
සීවලි බිසව වී සිල් ගුණ පිරුව එද
කණ්ඩහාල ජාතකයෙ කැටුව එද
මහිමිගෙ දිවි රැකපු බිසවුන් මමයි එද

37. විදුර පඬිව මහ විකුමන් පෑ එතුමා
යස ඉසුරින් ගුණ දම් පිරූ මහිමි තුමා
දහසක් පුරඟනන් හට අධිපතිව මෙමා
පජාපතිය වූයේ නම් මම ම තමා

38. මහෝෂධ පඬිව විකුමන් පෑ සමයේ
මහ සැප ලබන්නට අනුබලයක් වූයේ
ප්‍රේමෙන් බැඳී එකටම ජීවත් වූයේ
මම මයි එදත් අමරා දේවිය වූයේ

39. වෙස්සන්තරව පෘතුවිය කම්පා කරමින්
වස්තුව සමඟ අඹු දරුවන් පිනට දෙමින්
බුදු බව පිණිස සපිරීමට පෙරුම් දහම්
මද්දි දේවි වී අනුබල දුන්නේ මෙමම්

40. නොයෙකුත් තවත් සිය දහසක් ජාතිවල
බුදු බව ලබන්නට පාරමී පිරූ කල
ඔබ හා එක්ව පිරූ මා පාරමී බල
දුන් අනුබලය කාටත් කළ නොහැක මිල

41. වදක බිරිය සොර බිරියක් නොවී මම
දස සොයුරි මව් බිරියක් වෙ වී මම
පාරමී සපිරුවා සැම ජීවිතයේ ම
ඔබෙ යුතුකම් ද කිසිදු නැත අඩු වීම

42. ස්ත්‍රී පුරුෂ පින්වත් ඔබ අස ගන්න
රථයේ රෝද දෙක මෙන් ඔබ පසුවෙන්න
සිල් ගුණ පිනෙන් ඔබ දෙපළම සමවෙන්න
සම ලෙස ඔබගෙ ඔබෙ දිවි මඟ ගෙන යන්න

43. දයාවෙන් බිරිඳ සැමියා රැක ගත්තොත්
සමාවෙන් සැමියා බිරිඳට සැලකූවොත්
ප්‍රමාදෙන් තොරව ගුණ දම් සපිරූවොත්
අපායෙන් මිදී දෙදෙනම සුරපුර යත්

44. පෑවොත් අකටයුතුකම් තම සැමියාට
ගියොතින් පර පුරුෂයන් වෙත ඇසුරකට
දුන්නොත් දුකක් තම සැමියාගේ සිතට
යන්නම වෙනව ඔබ සැමහට අපායට

45. වසතොත් බිරිඳ සැමියට අම්මෙක් වාගේ
කීකරු දසියක් සොහොයුරියක් වාගේ
මිදිලා සිවු අපායෙන් ජීවිතෙ ඈගේ
අග මෙහෙසියන් වේ දෙවියන් රජුන්ගේ

46. පින්වත් මිනිසුනේ මම් පෙර ගිහි කාලේ
ගෞතම බුදු රජුන් හට බෝසත් කාලේ
වද සොර බාරියක් නොවුවෙමි කිසි කාලේ
දසි සොයුරි මව මෙන් වුනි සැම කාලේ

47. කල්ප ගණන් මෙලෙසින් එකටම ආවා
වෙසතුරු භවෙන් දෙදෙනම තුසිතපුරට ගියා
එතැනින් චුතව එකටම මෙලොවට ආවා
එක බුදු සසුනෙ එකටම අප නිවන් ගියා

48. අහසේ ඉඳන් මෙතුවක් පෙළහර පෑවේ
බ්‍රහ්ම වෙසින් ඉඳ විසිතුරු දම් දෙසුවේ
සිදුහත් කුමරුගේ අග මෙහෙසුන් වූවේ
යසෝදරා රාහුල මාතා මම් වේ

49. ඉන්පසු යසෝදරා තෙරණිය අහසෙ ඉඳන්
නැවතත් ධ්‍යාන බලයෙන් පොළොවට බසිමින්
සම්බුදු පියාණන්ගේ සිරි පා වඳිමින්
මේ ලෙස කියනවා තම ගුණ පළ කරමින්

50. බුදු සමිඳුනේ මා මේ පෙළහර පෑවේ
විසිතුරු ලෙසින් මා මේ සදහම් දෙසුවේ
දෙව් බඹ ආදි කිසිවෙකුගේ බලෙන් නොවේ
ඔබගේ උපදෙසින්මයි සැම දෙය කෙරුවේ

51. මේ පෙළහරින් හෝ විසිතුරු දම් දෙසුමෙන්
සිත කය වචනයෙන් වරදක් වූවා නම්
ඒ ගැන ඉවසමින් මැදහත් කරුණාවෙන්
මා හට සමාවෙනු මැන බුදු රජුනි උතුම්

52. සංසාරයේ මෙතුවක් පක්‍ෂව ආවා
පාරමි පුරන්නට අනුබලයක් වූවා
සසරින් වෙන් ව යන කාලෙත් ළං වූවා
මේ ඔබ දකින අවසන් වාරය වූවා

53. අප දෙදෙනාම සසරින් එතෙරව සිටියත්
මට මෙන් ඔබ වහන්සේටත් පෙනෙන නමුත්
සිදු කළ දේ කීම නම් නිෂ්ඵල වුවත්
අන් හට දැනගන්න මේ දෙය කියම් තවත්

54. සසරේ මෙතෙක් මාගේ ජීවිත ගණනින්
මගෙ දිවි ඔබට පිදුවා අපමණ විලසින්
ඔබ මා දුන්නු විට මතු බුදු බව පතමින්
එම දුන් මෙමම් ඉවසූයෙමි සතුටු සිතින්

55. ඔබ ඩැහැ ගන්න එන විට වග වළස් කොටි
මගෙ දිවි පුද ඔබෙ ජීවිතෙ රැකපු හැටී
මා වෙනුවෙන් ඔබත් ජීවිත පුදපු සැටී
රුදුරුයි මේ ලෙසින් සංසාරයේ හැටී

56. සසරෙහි එක්ව අපි පාරමී පුරමින්නා
ඇත් අස් නොයෙක් වස්තුව අපි දන් දුන්නා
බුදු බව පතා ඔබ දරුවන් දන් දුන්නා
තව තව මමත් දරුවන් බිහි කර දුන්නා

57. සක්විති රජය හැර තපසට වැඩිය කල
ඔබ හා එක්ව ගොස් සිල් ගුණ පිරූ කල
සාරාසංඛෙය්‍ය කප් ලක්‍ෂයක් තුල
ඔබ සමඟින් ම ආවෙමි මම මෙතෙක් කල

58. පෙර ජීවිත දකින නුවණින් ඉද්ධි බලෙන්
සුමධුර දහම් දෙසමින් පෙළහර පාමින්
දෙව් බඹ නර පිරිස් මැද සිහනාද කලෙන්
බුදු හිමි පැවසුවා තෙරණිට මේ විලසින්

59. රැස් වී සිටින පිරිසගෙ සැක දුරු වෙන්ට
මෙපමණ වෙලා ඔබ පෙළහර දක්වන්ට
සසරේ එක්ව මා සමඟින් පැමිණෙන්ට
පෙර කළ කුසලයත් මොවුනට පවසන්ට

60. පින්වත් සත්වයිනි එහෙනම් දැනගන්න
මා සුළු කුසලයක් කළෙ යැයි නොසිතන්න
මේ බුදු සසුනෙ අරිහත් ඵල ලැබ ගන්න
මා මෙන් පින් කළෙක් නැති බව දැන ගන්න

61. දීපංකර දසබල බුදු සමිඳුන්ගේ
ගිහි කල බිසව් වූ එම අග මෙහෙසුන්ගේ
රූ සිරි දැකල අපමණ සතුටක් වින්දේ
එම තනතුර ලබන්නට මා සිත බැන්දේ

62. මා එම ජීවිතේ ගිහි සැප අත්හරිමින්
පරිබ්බාජිකාවක් සේ සිල් රකිමින්
බුදු බව ලබනවා මතු ගෝතම නාමෙන්
විවරණ ලබනවා දුටුවෙමි එබෝසතුන්

63. එතුමා නමට මල් මිටි පහ පුද කෙරුවා
මගේ නමට මල් මිටි තුන පුද කෙරුවා
බුදු වෙන තෙක්ම බෝසත් අනුවම යෙමිවා
බුදු වෙන ජීවිතෙත් අගමෙහෙසිය වෙම්වා

64. යසෝදරා දේවිය නම් මම වෙම්වා
රාහුල පුතා හට අම්මා මම වෙම්වා
යනුවෙන් එද බුදු රජු ළඟ පැතුවෙම්වා
ඒ බුදු සමිඳුගෙන් විවරණ ලැබුවෙම්වා

65. සාරාසංඛ්‍ය ලක්ෂයෙ පින් කරමින්නා
ඒ බෝ සතුන් අනුවම සසරේ එන්නා
පාරමී පුරන්නට මම් අනුබල දුන්නා
බුදු හිමි මෙමට නිවනට අනුබල දුන්නා

66. දිව කන් නුවණ ඉද්ධියෙ බල මම් ලැබුවා
පර සිත් දන්න නුවණත් දිවසත් ලැබුවා
සසර දුක් නොමැති නිවනත් මම් ලැබුවා
කියමින් පිරිස් මැද සිහ නද පැතිරෙව්වා

67. මේ පෙළහර දුටු දෙව් මිනිසුන් සැම
සාදු සාදු නද පැතිරෙව්වා
අපමණ ස්ත්‍රීන් යසෝදරා වැනි
ගුණ ඇතියන් වෙම්වයි පැතුවා
දෙහොත් මුදුන් දී වඳිමින් තෙරණිය
යසෝදරා මේ ලෙස කීවා
සම්මා සම්බුදු සමිඳුනි මා හට
පිරිනිවනට අවසර දේවා

68. මගෙ පිරිනිවීම ඔබ වැනි අය නොදකීවා
අප පිරිනිවුම දෙවසරකින් සිදු වෙනවා
ඔබ සිතු විලස ඒ සැම දෙය සිදුවේවා
බුදු හිමි මෙලෙස තෙරණිට අවසර දෙනවා

69. තෙරණිය තුන් වතාවක් පැදකුණු කරලා
දහසක් තෙරණියන් සමඟින් පා වැඳලා
නොපෙනෙන තෙක්ම පස්සෙන් පස්සට වැඩලා
අරමට ගියා අවසන් වරටත් වැඳලා

70. දහසක් තෙරණිවරු නැඟ ආසනවලට
මුල සිට අගට නැවතත් අග සිට මුලට
සම වඳිමින් ලැබගත් සමවත්වලට
පිරි නිවි ගියා තෙල් සිඳි එපහන් ලෙසට

71. අපමණ කලක් මෙසසර ගමනේ යෙදුනා
එසසර ගමන දැවෙනා ගිනි කඳක් වුනා
නිරතුරු දැවෙන ගිනි කඳ ගුණ කඳක් වුනා
ගොර මරු පරදවා ගුණ කඳ පිරිනිවුණා

72. ඇති වූ දෙයක් ඇත්නම් වේ නැති වීම
අනිසයි තුන් ලොවේ පවතින දෙය සෑම
දිලෙනා පහන් බඳු තෙරණියෝ සැම දෙනම
එක දවසේම සිදු වුණි නිවිලා යාම

නිමි.

**පතිවෘතාවේ ප්‍රතිමූර්තිය යසෝදරාවය. ලොවේ උතුම් කුලඟන නම් යසෝදරාවෝ ය. ආගම් බේද, ජාති භේද, කුල භේද, ගෝත්‍ර භේද නැතිව සැම කතකට උතුම් චරිතයක් සඳ ගැනීමට බැලිය යුතු කැඩපත යසෝදරා චරිතය යි. සෑම දියණියක්, සෑම සොයුරියක්, සෑම ගෘහනියක්, සෑම මවක් ම කියවිය යුතු, දැනගත යුතු , ආදර්ශයට ගත යුතු චරිත කතාව යසෝදරා චරිතය යි. පින්වත් දියණියනි, සොහොයුරියනි, ගෘහනියනි, මව්වරුනි, ඔබේ සසර ගමනේ අවසානය දකින්නට යසෝදරාව මෙන් වන්න.**

# කර්ම විපාක දෙන සැටි

01. මෝහෙන් අන්ධ වී අකුසල් කරන දන
මරණින් පසු ගොසින් යළි උපදිනා තැන
නුවණින් සිත යොමා හොඳ හැටි අසාගෙන
දහමින් දිවි ගෙවමු නිවනින් සැනසෙන්න

02. මැරවරකමින් වද දී අන් අය මැරුව
ජර මර කළොත් මානෙන් ක්‍රෝධෙන් යුතුව
සැරවැරකමින් දුබලුන් පෙළුවොත් දැඩිව
දිවි හැර ගොසින් උපදින තැන සංජීව

03. යමපලුන් විසින් පව් කළ සතුන් හැම
අල්ලා පෙරළමින් ගිනි ගත් පොළොවේම
ආයුධවලින් කැපුවත් ඇඟ තැන සෑම
දුක් විඳ විඳ සිදු වේ ජීවත් වීම

04. මව්පිය හිත මිතුරු හා වැඩිහිටියන්ට
පැවිදිව සිටින සිල් ගුණයෙන් යුතු අයට
හිරිහැර විපත් හා කරදර කළවුන්ට
සිදු වේ කළු නූල් නරකය වෙත යන්ට

05. ගිනියම් වූ පොළොව මත පෙරලා හරිමින්
දැලිනූලෙන් සිරුර මත සලකුණු කරමින්
දස වද දි දී වෑ පොරොවෙන් සැස දමමින්
දුක් විඳවන අපායකි පව් කරන සතුන්

06. එළ මී හරක් අලි ඇතුනට වද දෙවමින්
අසරණ සතුන් හට වද දී වැඩ ගනිමින්
මිනිසුන් සතුන් හට වද දී මැරුවෝතින්
සංඝාතයෙහි උපදී පව්කමේ බලෙන්

07. නව යොදුනක් ඝනකම වූ පොළොව වෙතී
ඒ තුළ එරී පව් කළ අය නිසල වෙතී
මහ හඬ දි දී ගල් පරුවත පෙරළී එතී
පව් කළ සතුන් යට වී මැරි මැරී යතී

08. පව් කළ සතුන් උපදින රව්රව නරකේ
මහ සැර දුමක් නිරතුරු ඇතුළත කැරකේ
සිරුර තුළට යන දුම් වැළකිය නොහැකේ
කර්මය ගෙවුන දවසට එදුකින් වැළකේ

09. තෙරුවන් සතු දෙයක් අරගෙන කෑවාද
මව්පිය සතු දෙයක් සොරකම් කෙරුවාද
ගුණවත් අයගෙ වස්තුව වැනසූවාද
මහා රෝරු නරකෙට ඔබ යනවාද

10. ගින්නත් දුමත් කය ඇතුළට රිංගනවා
සිරුරින් ගලන ලේ සැම තැන පැතිරෙනවා
ඉවසිය නොහැකි දුකකින් කෑමොර දෙනවා
මහා රෝරුවේ දැඩි දුක් විඳුවනවා

11. පණ පිටින් සතුන් ගින්නෙන් දැව්වෝතින්
අන් සතු ගෙවල් ගින්නෙන් ඔබ දැව්වෝතින්
මහාතාප නරකෙට යන්නට වුණොතින්
උල්වල ඇනී ගිනි පොලොවේ දැවේ දුකින්

12. මරණින් පසුව යළි ඉපදුම නැතැයි කියා
මෙලොවම සියලු සැප සම්පත් විඳිමි කියා
පව් කළ සියලු දෙන යන්නේ කොහෙද කියා
දැනගනු මහ ප්‍රපාතය නරකෙටයි කියා

13. මව මැරු පියා මැරු රහතුන් මැරූ අය
සංඝ භේද කර මහ පව් කෙරූ අය
බෝසත් උතුමන්ගෙ ජීවිත නැසූ අය
ගුණවත් සිල්වතුන්ගේ දිවි නැසූ අය

14. බෝ ගස් කපා දගැබ් බිඳ දැමූ     අය
තෙරුවන් සතු වූ වස්තුව පැහැරගත්     අය
මිත්‍ර ද්‍රෝහී වී කළ ගුණ නොතැකූ     අය
සුරා බී බොරු කියා මිසදිටු ගත්තු     අය

15. තම බිරියන්ට දුක් කරදර දුන්නු     අය
පිළිම කඩා මහ අකුසල් කරපු     අය
බුදු සිරුරෙන් ලේ සෙල වූ දරුණු     අය
මේ සැම උපදිනා නරකය     අවීචිය

16. ලෝහ පවුරකින් වට වී උඩින්     යටින්
ගිනි ගෙන දිලෙනවා සැමදා     නිරන්තරෙන්
ගිනි දැල් දුවනවා දවමින් සියලු     සතුන්
මර හඬ නැගෙනවා නිරතුරු     අවීචියෙන්

17. අට මහ නරකයයි මේ විස්තර     වූයේ
පව් කළ අයටමයි මේ සැම ඇති     වූයේ
නරකෙන් මිදුන කල යළි කොහි     උපදිනුයේ
ප්‍රේත ලොවේ බව සුදනෙනි     දැනගනුයේ

18. හරි ලක්ෂණයි රන් වන් පාටයි     සිරුර
ඌරු කටකි පණුවන් වැගිරෙයි     නිතර
මහා ප්‍රේතයෙක් මෙලෙසින් සිටියෙ     පෙර
ඔහු කළ කර්මෙ මෙලෙසින් දැනගනු     මිතුර

19. කසුප් බුදු රජුගෙ සසුනෙහි     මහණෙක්ය
පිරුවේ මහණ දම් හරි     සිල්වත්ය
එනමුත් වචනෙ නම් හරි සැර     පරුෂමය
බැන්නේ සඟ ගණට වචනෙන්     නින්දිතය

20. ශීලයෙ බලෙන් සිරුරෙහි පැහැ     පියකරුය
වචනය නරක් වී කට ඌරගෙ     වැනිය
පරුෂ වචන මෙන් පණුවන්     වැගිරේය
ප්‍රේත ලොවේ ඇති මේ දුක්     බියකරුය

21. පෙර එක් ගැහැණියක් දරු ගැබ හෙළුවාය
නොකළෙමි කියා බොරුවට ඇය දිව්රාය
මැරී ප්‍රේතියක් වී ඇය ඉපදුනාය
දුගඳයි පිළිකුලයි ඇය දැන් නිරුවත්ය

22. උදේ සවස ඇය දරුවන් බිහි කරමින්
ඉවසිය නොහැකි ඇය සා දුකකින් පෙළෙමින්
තම දරුවන් ඒ මොහොතෙම කා දමමින්
මහ දුක් විඳිනවා කළ අකුසල් විලසින්

23. සැමියෙක් බිරිඳ හා වැසුවේ පෙර කාලේ
සැමියා සැදැහයෙන් දන් පින්කම් ද කළේ
භාරිය පින් නොකර දනෙට බාධ කළේ
සැමියගේ දනයට මසුරුව ශාප කළේ

24. නුඹ දෙන අහර පරලොවදී අශුචි වෙයන්
සැරව මුත්‍ර වී නුඹ හට පහළ වෙයන්
නුඹ දෙන වස්ත්‍ර මතුවට ගිනි තහඩු වෙයන්
කියමින් ශාප කළෙ සැමියට ක්‍රෝධ සිතින්

25. සැමියා මැරී ඉපදුනෙ දෙවියෙක් වීලා
මසුරු බිරිය ඉපදුනේ ප්‍රේතිය වීලා
සැමියට කරපු ශාපය දැන් එල දීලා
ප්‍රේතිය දුක් විඳී ලේ මුත්‍රා බීලා

26. එක් ප්‍රේතයෙක් ගිනි වී බොල් හිසේ දමයි
තව ප්‍රේතයෙක් මුගුරෙන් තම හිසම බිඳියි
එක් ප්‍රේතියක් තම මස් ලේ රසට බුදියි
තව ප්‍රේතියක් කන්නේ පිළිකුල් අසුචියි

27. කූට වෙළෙන්දෙක් වී බොල් විකුණු පවින්
මහ දුක් විඳි ගිනි වී බොල් හිසට දමන්
ඔහුගේ පුතා සිය මව හට පහර දෙමින්
කළ පාපය විඳවයි තම හිස බිඳිමින්

28. ඔහුගේ බිරිඳ මස් සොරකම් කරපු     පවින්
මහ දුක් විඳී තම ඇඟ මස් ලේ     බුදිමින්
වස්තුව සඟවගෙන බොරුවට දිවුරු     පවින්
මහ දුක් විඳී පිළිකුල් අසුචිම     බුදිමින්

29. දෙපුතුන් හා සොයුරි දන් දී බණ     ඇසුවා
එපිනෙන් දෙව් ලොවේ දී සුර සැප     ලැබුවා
පින්කම් නොකර මව්පියෝ ගොන්කම්     කෙරුවා
ප්‍රේත ලොවට ගොස් අපමණ දුක්     ලැබුවා

30. දහවල් සතුන් මරමින් පව්කම්     කරමින්
රෑ දඩයමින් වැළකී පව්     නොකිරීමෙන්
මරණින් පසුව වැද්දෙක් දුගතියට     ගොසින්
රෑ සැප විඳී දහවල් දැඩි දුක්     විඳිමින්

31. බිරිඳත් දුවත් ලේලිත් බුදු පුදට     යමින්
සුවඳත් මලුත් අර ගත්තා සැදැහැ     සිතින්
සැමියා ඒ උතුම් පින්කම වැළකූ     පවින්
මහ ප්‍රේතයෙක් වී සිටියා දුක්     විඳිමින්

32. එක් මිනිසෙක් පන්සල ගිනි තැබූ     පවින්
අවීචියෙ ඉපිද මහ ගොර දුක්     විඳිමින්
නැවතත් ප්‍රේතයෙකු වී ඔහු     ඉපදීමෙන්
මහ දුක් විඳී සිරුරම ගින්නෙන්     දැවෙමින්

33. දුසිල් මහණෙකුට එක් වූ     දායකයෙක්
සිල්වත් මහණුන්ට බැන කරගත්තෙ     පවක්
දෙදෙනම මැරී ගොස් ලැබුවා ප්‍රේත     බවක්
ඉන්නට ලැබුනෙ දෙදෙනට මහ අසුචි     වලක්

34. ප්‍රේත ලෝකයෙන් මිදුනක් ඇතැම්     අය
මරණින් පසුව ලබනව තිරිසන්     භවය
මිනිසත් ඇසට පෙනෙනා මෙම     අපාය
ඉපදීමට හේතු වෙන්නේ     මුලාවය

35. රජෙකුට බිසව් වී අඟනක් වැජඹෙන්නා
මරණින් පසුව කුරුම්ණි ධේනුවක් වුනා
පින් නොකරමින් අඟනක් කය සරසමිනා
මරණින් පසුව ගොස් කණ කෙකණියක් වුණා

36. මානෙන් උඩගු වී ජීවිත ගෙව්වෝතින්
ගස් උඩ ලගී රිළවුන් වඳුරන් වීමෙන්
දැඩි මානයෙන් මත් වී ගරු නොකළෝතින්
නීච බවට පත් වේ බල්ලන් වීමෙන්

37. රස ලෝභයෙන් නිරතුරු පව් කෙරුවෝතින්
තණ කොළ බුදින්නට වේ ගවයන් වීමෙන්
පිළිකුල් නැතිව පාපයෙහිම යෙදුනෝතින්
අසුචිම බුදින්නට වේ ඌරන් වීමෙන්

38. වෛර ක්‍රෝධ නිරතුරු සිත තුළ වැඩුවොත්
නයි පොළඟුන් කොටි කඩියන් වී උපදිත්
අනුනට දුක් දි දී තමනුත් දුක් විඳවත්
මිනිසත් බව නොලබති බොහෝ කලක් යතත්

39. ජලයෙහි ඉපිද ජලයෙහි සිට මැරී යති
අසුචියේ ඉපිද අසුචියෙ සිට මැරී යති
අඳූරෙහි ඉපිද අඳුරෙහි සිට මැරී යති
තිරිසන් අපායෙහි අපමණ දුක් විඳිති

40. රාග ද්වේශ මෝහය ඇති බියකරුය
නිරය ප්‍රේත තිරිසන් ගති ඇතිකෙරෙය
දෙව් මිනිස් සියලු සම්පත් නැතිකෙරෙය
භවයෙන් එතෙර නිවනට අති අවහිරය

41. දිවා රෑ දෙකේ සුව නින්දක් නොලබයි
බියෙන් තැති ගැනීමෙන් සැම ජීවත් වෙයි
කුඩා සතුන් ලොකු සතුනට ගොදුරක් වෙයි
ඉවසිය නොහැකි දුකකින් මරණෙට පත්වෙයි

42. තිරිසනුන් වෙලා ඉපදුනොතින් ලෝකේ
රස බොජුන් කිසිත් වළඳන්නට නොහැකේ
නිරුවතින් වසයි විළි වැසුමට නොහැකේ
සීතලෙන් පෙළේ දිව රෑ නොමැත සැකේ

43. නිරයෙහි විඳින දුක් අවසන් වූ දිනෙක
ප්‍රේත ලොවේ ඉපදී දුක් විඳි නොයෙක
තිරිසන් භවෙන් මිදී මිනිසෙක් වූ දිනෙක
ඉතිරි වු කර්මයෙන් විඳිනව දුක් නොයෙක

44. සිටු කුමරියක් තෙරණියගෙන් රැගෙන වැඩක්
ඉපදුන භවෙන් භවෙ ලැබූවා දස කමක්
පසේ බුදු කෙනෙකු හට කර කවට කමක්
පාපය ගෙවන තුරු ලැබුවා කුදු වීමක්

45. ඉසුරුමතෙක් සෑ මළුවක උඩඟු සිතින්
පාවහන් පැළඳ ඇවිදපු එම පාපෙන්
රජ සැප වැළඳුවත් ඒ බිම්සර නිරිඳුන්
දෙකකුල් පලා ලුණු දැමුවා නොවෙද ඉතින්

46. වෙදෙක් වෙලා ලෙඩෙකුට වෙදකමක් කළේ
මුදල් නොගෙව්වට ඇස් දෙක අන්ධ කළේ
පාල තෙරිඳු ලැබ ගත්තත් රහත් බලේ
ඇස් දෙක අන්ධවිය කර්මය දුන්න පලේ

47. කුරුල්ලන් මරා ජීවත් වූ වැද්දෙක්
අත් තටු කඩා වද දීමෙන් කළේ පවක්
මේ බුදු සසුනෙ ලැබ ගත්තත් පැවිදි බවක්
රහත් වුවත් ලැබුවේ කුණු වූ සිරුරක්

48. පෙර මහණෙක් පිරිකරකට වී ආශා
ගිහිගෙට යන්න භික්ෂුවකට වැඩ සලසා
මහණ වුවත් සතුටින් තම සිත සනසා
මහණකම එපා විය කර්මය විලසා

49. ගොපලු දරුවෝ පිරිසක් තලගොයි පැටියෙක්
තුඹසක සිර කරලා දුක් දුන්නේ සතියක්
මේ බුදු සසුනෙ ලැබ ගත්තේ පැවිදි බවක්
ගල් ගෙයි සිරව දුක් වින්ද දවස් හතක්

50. අනුන්ගෙ දනයක් වැළකූ පෙර මහණෙක්
අපායේ ඉපිද දුක් විඳ බොහෝ කලක්
නැවතත් යක්ෂයෙන් වී භව පන්සියයක්
සුනඛයෙක් වුනා ජීවිත පන්සියයක්

51. එයින් මිදී ලැබුණත් මිනිසත් භවයක්
සැප නොලබාම ගෙව්වේ දුක් ජීවිතයක්
මේ බුදු සසුනෙ ලැබ ගත්තත් පැවිදි බවක්
කුස පුර අහර නොලැබූයේ රහත් වුවත්

52. පසේ බුදු කෙනෙක් මහ මඟ වඩින විට
කාරා කෙළ ගැසූ මිනිසෙක් එතැන් සිට
අපමණ දුක් වින්දෙ ඔහු නරකයේ සිට
මිනිසෙක් වෙලා හැදුනේ රෝගය කුෂ්ඨ

53. අඹු සැමි දෙදෙනෙක් පෙර කල දූපතක
පැටවුන් සමඟ බිත්තර කෑ පාපයෙක
කළහොත් කර්මයක් දෙනවා විපාක
දරුවන් නැතිව දුක් වින්දේ බොහො කලෙක

54. දස වද දි දී මිනිසෙක් ඌරන් මැරුවා
ඒවා විකුණමින් මස් රස කර කෑවා
කලකදි ලෙඩ වෙලා මහ දුක් විඳවූවා
ඌරෙක් විලසින් ම මරණෙට පත්වූවා

55. වලවල් කපා උල් සිටවා කැලේ ගොසින්
ඇතුන් මැරූ මිනිසෙක් ගජ මුතු සොයමින්
වලකට වැටී දින ගණනක් දුක් විඳිමින්
මැරුණා ඔහුත් මැරෙනා අලියෙකු විලසින්

| | | |
|---|---|---|
| 56. | බත් පත කාපු වරදට අසරණ | බළලෙක් |
| | උගෙ ඇස් ගලවමින් වද දුන් | ජූජකයෙක් |
| | ඇස් ලෙඩ සෑදී ඔහු ලැබුවා අන්ධ | බවක් |
| | මැරෙනා තුරු ම ඔහු වින්ද දරුණු | දුකක් |
| 57. | දරුවන් හට පියෙකුගෙ මස් කැවූ | පවින් |
| | එම තරුණයන් මැරුණෝ තම මස් | බුදිමින් |
| | ගවයන් මරා උන්ගේ දිවවල් | කෑමෙන් |
| | මිනිසෙක් මැරුණෙ දුක්විඳ දිවි | පිළිකාවෙන් |
| 58. | වද දී පියෙකු හට මැරුවා වස | දීලා |
| | මැරුණේ පුතත් වද විඳ විඳ වස | බීලා |
| | තවෙකෙක් අම්මා මැරුවේ වලකට | දලා |
| | මැරුණා එම පුතා බොරු වළකට | වැටිලා |
| 59. | වද දී තරුණන්ට පොලිසියෙ නිල | දරුවෙක් |
| | වන වී මුළු සිරුර වින්දේ මහත් | දුකක් |
| | හිසට පහර දී මිනිසුන් මැරු | සෙබළෙක් |
| | මැරුණෝ මොලේ ලෙඩ වී විඳ මහත් | දුකක් |
| 60. | කර්මයෙ විපාකය මේ ලෙස දරුණු | බව |
| | සුදනෙනි මේ ලෙසින් දහමෙන් දැන | ගනුව |
| | පවින් වැළකී කරතොත් පින් | නිරතුරුව |
| | සැනසුම ලබනවා නියතයි එය | දනුව |
| 61. | සුළු දානයක් දී අනුරුද් තෙරුන් | දැක |
| | ඉන්දික දුගිය ඉපදුනෙ දෙව් | ලෝකයක |
| | බොරු නොකියා ඇත්තම කිවු කතක් | එක |
| | එපිනෙන් ඉපදුනේ ඇය දෙව් | ලෝකයක |
| 62. | නොකිපී බැනුම් ඉවසූ දසියක් | එක |
| | මැරිලා ගොසින් ඉපදුනෙ දෙව් | විමානෙක |
| | අනුනගෙ දනයක් සතුටින් බෙදූ | එක |
| | තරුණෙක් ලැබුවෙ අපමණ සැප දෙව් | ලොවක |

63. සඟ රුව දැකල සිත පැහැදූ ගවයෝ රැළක්
මරණෙන් පසුව ලැබ ගත්තේ දිව්‍ය සැපක්
තෙර නම කෙරෙහි සිත පහද ගත් ගවයෙක්
දෙව් ලොව ගොසින් ලැබ ගත්තේ මහත් සැපක්

64. දහම් හඬ ඇසූ මැඩියෙක් පෙර කලෙක
එයින් චුතව ඉපදුනෙ දෙව් ලෝකයක
සතිපට්ඨානෙ ඇසූ වව්ලන් පන්සියෙක
මිනිසත් භවේ ඉපදී ඇත එක් ගමක

65. වැස්සේ නමුත් බෝධියකට පැන් පිදුයේ
දෙඅනූ කපක් සුගතියෙ මහ සැප ලැබුයේ
බෝ කොළ ඉවත් කළ මිනිසෙක් පෙර භවයේ
එතැන් පටන් දුගතියකට නොමැත ගියේ

66. බෙහෙත් පිදූ එක් තවුසෙක් අතීතයේ
අපමණ සැප ලැබුවේ උපදින සැම භවයේ
පැවිදි බවක් ලැබ ගත්තේ මේ භවයේ
නිදුකින් බොහෝ කල් සිට නිවනත් ලැබුයේ

67. දන් සිල් භාවනා කරතොත් සුපින්වත
ඉන් ලැබෙනා සැපත් මේ ලොව නිමක් නැත
පින් කරනා අයට දුගතිය වැසී ඇත
දම් පිළිවෙතින් ලැබ දේ සග මොක් සැපත

68. සදහම් එළිය ලොව දස අත පැතිරේවා
අවිදු අඳුර සැම සිත් තුළ පහ වේවා
පාරමී පුරන්නට සැම දෙන යොමු වේවා
ලොව සත්වගට හොඳ නුවණම ඇති වේවා

නිමි.

# කයේ සැටි මේ බලන්න

**කෙස්**

01. හිසේ පුරා කෙස් කලු පැහැයකින් වෙසේ
වෙසේ හිස් කබල පිට සුදු සමක් මෙසේ
මෙසේ දුගඳ පිළිකුල ඉවසයි ද කෙසේ
කෙසේ කළු පැහැය සුදු වෙයි පැසුණු හිසේ

**ලොම්**

02. ලෝම පෙනේ තඹවන් කළුවන් සේම
මෙම කුණු කයේ අමු සම මත මතුවේම
දුගඳයි පිළිකුලයි නිරතුරු මේ සැවොම
ලෝමෙන් ගැවසි සිරුරට ඇති වෙද පේම

**නිය**

03. නියපොතු විසිඟිල්ල අග පිළිපොතු සේමා
පාට උලා හැඩ වැඩ දැමුවත් සැවොමා
දුගඳයි පිළිකුලයි මෙහි ඇති තතු නියමා
මේ කය පිහිටි සැටි බලනුව නුවණ යොමා

**දත්**

04. දත් ඇට තිස් දෙකකි ලබු ඇට ලෙසින් දකී
එක්කොන් දෙකොන් තුන්කොන් මුල් සිවු කොනකි
සුදු පැහැ වුවත් මෙහි ඇත්තේ පිළිකුලකි
දුගඳවු කටේ දත් තතු සේ බලන් සකි

**සම්**

05. මුළු ගත වැසුන අමු සුදු සම් සැට්ටයකි
රන්වන් කළු තලෙලු වර්ණයකින් ද දකී
දුගඳ වූ කුණු සමේ ඇත්තේ පිළිකුලකි
නුවණින් නොබැලුවොත් වෙන්නේ මුලාවකි

**මස්**

06. ඇට ගොඩ වැසී ඇත ගෙට ගැසු මැටි සේමා
මුළු ගත පුරා පණුවන්ටයි මෙය උරුමා
හැඩ වැඩ ලෙසින් සැදුනත් කුණු මසම තමා
නුවණින් බලනු දුගඳයි පිළිකුළම තමා

**නහර**

07. මුළු ගත පුරා ලේ ධාරා රැගෙන යන
ඇට මස් අතර මේ මුළු ගත වෙලා ගෙන
වරදැල් සදිසි වීනා තත් බඳු පෙනෙන
ඇට මස් වෙලී නහර බලනුව පිළිකුලෙන

**ඇට**

08. තුන්සියයක් මසින් වැසිලා තිබෙන ඇට
සැකිල්ලෙකි සුදෙන් ගැලපී තිබෙන විට
මමෙක් නැත මෙතුළ බිය වේ බලන්නට
පිළිකුළෙන් බලනු නොඇලී ඇටෙන් ඇට

**ඇට මිඳුළු**

09. ඉදුණු වේ බඩක් සේ සටහන් පැවති
සියලු ඇට කුහර තුළ සුදු පැහැය වෙති
සැමගෙ ගත සවිය රැක දෙන බලය ඇති
පිළිකුලයි ගඳයි ඇට මිඳුළුවල නිති

**වකුගඩු**

10. සිරුරෙහි ජලය මුත්‍රා ලෙස පෙරා දෙති
ඇටඹ විලස අඹ හැඩයෙන් දෙකක් වෙති
මදරත් පැහැයකින් මේ කය ඇතුලෙ ඇති
පිළිකුල් දෙ වකුගඩු වක් කා තුළත් ඇති

**හදවත**

11. රත් පැහැයකින් පපු කුහරය තුළ පවතී
යටිකුරු කළ නෙළුම් කෙමියක් විලස වෙතී
නිරතුරු මෙයින් ලේධාරා නිකුත් වෙතී
පිළිකුල බලනු ඔබෙ හදවත තුළ පැවතී

**අක්මාව**

12. මුලින් එකකි අග කෙළවර දෙකක් වේ
කොබෝලීල කොළයක හැඩයෙන් යුතු වේ
මේ කය ඇතුළෙමයි ඇත්තේ පඬු පැහැ වේ
දුගඳයි පිළිකුලයි ඇත්තේ අක්මාවේ

**ඇලදිව**

13. කළු වස්සගෙ දිවට බඳු දිග සත් අඟලයි
පපු කුහරයේ හතවද වම් පසෙහි තිබෙයි
පිටවුණු කලට සැනෙකින් මරණය ගෙනදෙයි
ඇලදිව මෙකය තුළ ඇති පිළිකුලයි ගඳයි

### පෙනහල්ල

14. පපු කුහරයේ ඉදිරියෙ එල්ලී ඇත්තේ
වැටකොලු කොහු විලස කෙඳි ඇතුළත ඇත්තේ
රත් පැහැයෙන් ලේ පෙණ පිරිලා ඇත්තේ
පිළිකුල් පෙණහැල්ල කොයි කාටත් ඇත්තේ

### දළඹුව

15. හදවත පෙනහල්ල වටකොට වැසී ඇති
මේ ගත පුරා ඇති මස් පිඩු එතී ඇති
දරුවන් වසන තැන මව්නගේ කුසේ ඇති
දුගඳක් පිළිකුලක් දළඹුව තුළත් ඇති

### බඩවැල

16. මුඛයෙන් පටන් ගෙන ගොස් ගුදයෙන් නිමවෙයි
විසි එකකට නැමී කුස තුළ දරණ ගැසෙයි
පිත් සෙම් අහර මල අසුචිත් පිරී තිබෙයි
බඩවැල සැම දෙනාගෙම පිළිකුලයි ගඳයි

### අතුණු බහන්

17. බඩවැල් වැටිය වටකොට ගිලිහෙනු නොදෙන
විසි එක් තැනින් නැමි බඩවැල එතීගෙන
සුදු පාටින් සියුම් ලෙස කුස තුළ රඳන
ගඳයි පිළිකුළයි බඩවැල් එතු රැහැන

### නොදිරූ ආහාර

18. මුඛයෙන් ඇඹරිලා ගොස් කෙළ සමඟින්න
ආමාශයෙහි පිත් සෙම් සමඟින් පැසෙන
ආවොත් පිටට බලු වමනය සේ පෙනෙන
කුස තුළ අහර ඇත්තේ ගඳ පිළිකුලෙන

### දිරූ ආහාර

19. එකතු වෙලා කන බොන දේ වට වී ඉඳ හොඳට රුචී
පිතත් සෙමත් සමඟ පැසී ආමාශයේ ඇඹරිච්චී
පක්වාශයේ බඩවැල තුළ වතුර පෙරී මිරිකිච්චී
සැඟවී ඉඳ පිට කරන්නෙ ගඳෙන් පිළිකුලෙන් අසූචි

### හිස් මොළය

20. උඬගු වුවත් මානෙන් ඔලුව පුම්බා
හිස් මොළ පිරී ඇත ලොඳ සේ කුරුම්බා
ඇති තතු දකින සේ හොඳ නුවණා පුම්බා
පිළිකුල බලනු මැන මානය හිසින් බා

### පිත

21. පිත්තාශයේ සිට ආමාසෙට ගලතී
කලුපාටින් මී තෙල් විලසින් පවතී
අහර දිරයි වැඩි වූ කළ උමතු වෙතී
දුගඳයි පිළිකුලයි පිත මේ කයෙහි ඇතී

### සෙම

22. උගුරෙහි පටන් ආමාශය තෙක් පවතී
ආහාරත් සමඟ පෙණ දමමින් පැසෙති
කෑලිය බෙලසුලක් සේ සුදු පැහැය වෙතී
පිළිකුල් දුගඳ සෙම මේ කුණු කයේ ඇතී

### සැරව

23. නිතර නොමැත ගෙඩි වණයෙන් වැගිරේය
පඬු පැහැයෙන් මේ සිරුරෙහි ඇතිවේය
වැගිරෙන කලට නිළමැස්සන් දිව ඒය
පිළිකුල් දුගඳ කුණපය සැරවය වේය

### ලෙය

24. නිය දත් වියළි සම් කෙස් ලොම්වල නොමැතී
නරහ තුලින් සිරුරේ සැම තැන දුවතී
ගැලුවොත් පිටත ගඳ ඉවසිය නොහැකි වෙතී
පිළිකුල් කුණපයක් මෙහි ලේ නමින් ඇති

### ඩහදිය

25. කේශ ලෝම කූපෙන්මයි මතු වෙන්නේ
රත් වූ කලට මුළු සිරුරින් වැගිරෙන්නේ
නොසේදුවොත් සිරුරෙන් ගඳමය එන්නේ
පිළිකුල් කුණප කොටසකි ඩහදිය වන්නේ

### මස් තෙල්

26. සම් මස් අතර කහ පැහැයෙන් යුතු වන්නේ
කෙණ්ඩා කලවවල වැඩියෙන් පවතින්නේ
මේ තෙල් නිසා සම පැහැයෙන් බැබළෙන්නේ
එහෙත් දුගඳ මස් තෙල් පිළිකුල් වන්නේ

**කඳුළු**

27. සිනහව සෘතු ගුණෙන් ඇස් දෙක තෙමාලන
කවුරුත් හඬන විට දෙනෙතින් ගලන් එන
පහන් තෙලට බඳු වූ පැහැයෙන් පෙනෙන
පිළිකුල් කුණපයකි කබ කඳුළු වැගිරෙන

**වුරුණු තෙල්**

28. අතුල් පතුල් කන් නාසයෙන් මතු වෙන
ඩහදිය සමගින් ම මෙකයින් ගලන් එන
තල තෙල් පැහැ ඇතත් හිරු රැසින් බබලන
පිළිකුල් වුරුණු තෙල්මය සිරුරින් ගලන

**කෙළ**

29. දිවා රෑ දෙකේ නිති දිවගට උනන
මැරෙන තුරුම කිසි මොහොත නොනවතින
සුදු පැහැ වුවත් පෙණ පිඬු විලසින් පෙනෙන
පිළිකුල් දුගඳමය කෙළ මුඛයෙන් ගලන

**සොටු**

30. හිස් කබලෙමයි තල් ලොඳ සේ ඉපදීම
සෘතු ගුණ ධාතු කෝපෙන්මයි මෙය සැදුම
හිස් මොළ ගිලිහි හිස් විවරෙන් බැස්සාම
පිළිකුල් සොටුය නාසා පුටයෙන් ගලන

**සඳමිඳුළු**

31. නැවෙන සන්ධි තුළමය මෙය පිහිටීම
ආලේපය කරයි බෙලසුල්ලක් සේම
රිදුමක් ඇති කළත් මෙය අඩු වී යාම
සන්ධි ලාටු පිළිකුල්මයි සැම දාම

**මුත්‍රා**

32. සිරුරෙන් පෙරී මුත්‍රාශයෙ පිරුණාම
මුත්‍රා නාලයෙන් වන්නේ පිටවීම
පෙනුනත් කොල්ලු දිය පැහැ කරදිය සේම
දුගඳයි පිළිකුලයි මූත්‍රා ගැලුවාම

**නිගමනය**

33. මෙලෙසින් කයේ සැටි හොඳ හැටි බලනවද
සිරසේ පටන් කෙළවර ඇත්තේ පාද
රන් මිණි මුතු රිදී මෙහි තුළ තිබෙනවද
නැති නම් වෙනත් හරයන් හමු වෙනවාද

## සලකා බැලීම

34. විලවුන් සුවඳ සැන් පව්ඩර් උලනවද
කුණු ගඳ එයින් මෙකයහි නැති වෙනවාද
නව දෙරකින් මෙතෙක් ගැලුවේ මොනවාද
මේ කය රැකුම කිසිදු ඇති වෙනවාද

## ගලපා බැලීම

35. සබඳ මේ ලෙසින් කය දෙස බලනවද
අන් සැම සිරුරු මේ ලෙසමයි සිතනවද
මෙලෙසින් කුණු කයට අලය අරිනවද
නැති නම් කුණු කයට බැඳිලා සිටිනවද

## තිලකුණට නැගීම

36. වෙනස් වෙයි නිතර මේ කය අනිත්‍යයි
පීඩා ඇති කරයි මේ කුණු කය දුක්ඛයි
මගේ නම් මෙලෙස මේ දෙය සිදු නොම වෙයි
අසාරයි දෙතිස් කුණපය අනාත්මයි

## ආර්‍ය්‍ය සත්‍ය දැකීම

37. අනිස දුක් අනත් කය දුක්ඛ'රි සත්‍යයි
මෙකයට හේතු ලෝභය සමුදය සත්‍යයි
ලෝභ නැති නිවන නම් නිරෝධ'රි සත්‍යයි
ලෝභය නසන පිළිවෙත මග්ග'රි සත්‍යයි

## අනුශාසනාව

38. දෙතිස් කුණප රැඳි මේ කය දුකක් වේ
මේ කුණු කයට ආලය සමුදයත් වේ
පිළිකුල වැඩුම ආලය නසන මග වේ
ආලය හලොත් නිවනේ සුවයම අත් වේ

නිමි.